# 2022 අගෝස්තු 09

# මහා සභා රැස්වීමේ වාර්තාව

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

## මහා සභා රැස්වීම් වාර්තාව - 2022 අගෝස්තු

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.08.09 වෙනි දින පෙ:ව: 09.30 ට දෙහිඕවිට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ වූ 2022 අගෝස්තු මස මහා සභා රැස්වීමේ වාර්තාව.

සහභාගීත්වය:

1. ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා - ගරු සභාපති
2. ආර්.ඒ.විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා - ගරු උප සභාපති
3. අමිල කන්දෙආරච්චි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
4. ඩබ්.අබේසේන මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
5. ඩී.එස්.එම්.නිමල් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
6. යූ.ජී.සරත් විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
7. එම්.ටී.ආර්.ලක්මාල් සමරරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
8. එච්.අමරාවතී මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
9. ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. කේ.නිශාන් මැතිතුමා. - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. පී.ර්.ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
12. අතුල ජයසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. කේ.ඩී.එන්.ප්‍රියන්ති මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
14. පී.වී.එන්.සඳමාලි විජේරත්න මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
15. කේ.විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
16. යශෝධ ලලංග පද්මසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
17. යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
18. ජේ.ඩී.තුෂාර අමරසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
19. යූ.සුධර්මා ලක්මාලි විජේසේකර මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
20. අරුණ ශාන්තසිරි නිල්වල මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
21. සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
22. එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
23. ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
24. පී.කේ.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
25. එම්.වි.සුගත් මාධව මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
26. ආර්.පි.ශ්‍රියානි ජයකොඩි මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
27. රනිල් චන්ද්‍ර කුමාර විජේසිරි මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
28. එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
29. කේ.ජී.ඒ.කේ.සුමනදාස මැතිණිය -ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී
30. බී.ඒ.නීතා බාලසූරිය මැතිණිය -ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී
31. ඩී.ජී.එච්.සී.කේ. පියරත්න මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී
32. එච්.ඒ.කේ.එන්.ජයවිර මැතිතුමා - ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

නොපැමිණි:

01. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා.
02. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී දිස්නා කුමාරි වීරක්කොඩි මැතිණිය.

කාර්යාල නිලධාරීන්:

I ආර්.ඩී.නලින් පුෂ්පකුමාර මහතා - ලේකම්
II. ඩී.එම්.එන්.එන්. දිසානායක මිය - සංවර්ධන නිලධාරී.
III ආර්.ඩබ්.එම්.ඊ.චන්ද්‍රවීර මිය - කළමනාකරණ සේවා නිලධාරී.

සභාවට පැමිණි සියලු දෙනා ආගම සිහිකිරීම, රණ විරුවන් සිහිකිරීම හා පළාත් පාලන ගීතය ගායනා කිරීමෙන් අනතුරුව සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) 2022.07.12 දින පැවැත් වූ මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම:**

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022.07.12 වෙනි දින පවත් වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සියලුම මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇති බවත් එම වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් ඇත්නම් ඉදිරිපත් කරන ලෙසත්,එසේ නොමැතිනම් එම මහා සභා වාර්තාව සභා සම්මත කරන ලෙසත් දන්වන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.අමරාවතී මැතිණිය:**

2022.07.12 වෙනි දින පැවති මහා සභා රැසවීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බව ප්‍රකාශ කර සිටියාය.

**ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.07.12 වෙනි දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත විය.

**(ආ) ගරු සභාපතිතුමාගේ නිවේදන: නැත**

**(ඇ)** ප්‍රාදේශිය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා නිවේදන සභාවට ඉදිරිපත් කිරීම :

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

- ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය මඟින් පැවැත්වීමට අදහස් කර ඇති විවාද තරඟාවලියක් පිළිබඳව දන්වා පළාත් පාලන ආයතනයන්ගේ සංසදයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් යොමු කරන ලද ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී. මේ සඳහා සහාගී වීමට අපේක්ෂා කරන්නේ නම් නිත්‍ය තරඟකරුවන්/තරඟකාරියන් 04 දෙනෙකු සහ අතිරේක දෙදෙනෙකු ඒ සඳහා සූදානම් වන ලෙසත් දන්වා සිටියේය.

- දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 ( l ) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති විසින් සම්පිණ්ඩිත වාර්තාවේ විගණකාධිපතිගේ නිරීක්ෂණය සභාව වෙත ඉදිරිපත් කරන ලදී. ඒ අනුව " එම වාර්තාවේ තත්වා ගණනය කළ මතය සඳහා පදනම කොටසින් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිඹිබු කරන බවට " ප්‍රකාශ කර ඇති බව දන්වා සිටින ලදී.

**(ඇ)** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න: - ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

2022.06.21 වෙනි දින පැවති පරිර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාවේ අංක 01 ගැටළුවට සම්බන්ධයෙන් 2022.07.12 දින පැවති මහා සභා රැස්වීමේදී සාකච්ඡා වූ පරිදි

I. යෝජිත කර්මාන්ත ශාලාවේ ඉදි කිරීම් තාවකාලිකව නවැත්වීමට සභාව විසින් නියෝග කරනු ලැබුවේද ?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

නියෝග කර ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

II. එම තීරණය විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා දෙහිඕවිට පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කර සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කර තිබේද ?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

2022.07.26 වෙනි දින CIB iii 20/171 අංකය යටතේ දෙහිඕවිට පොලිස් ස්ථානයේ අදාල ඉදි කිරීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

III. එම කර්මාන්ත ශාලාව නිසා දෙහිඕවිට නගරයේ ජනතාවගේ පානීය ජලය අපවිත්‍ර වීමට ඉඩ ඇති බැවින් මේ සම්බන්ධයෙන් ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කිරීමට කටයුතු කර තිබේද ?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එම කර්මාන්ත ශාලාව අදාල ස්ථානයේ ස්ථාපිත කර පවත්වාගෙන යාම සුදුසුද නැද්ද යන්න පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා දෙන ලෙස දන්වා 2022.07.18 දින ජල සම්පාදන මණ්ඩලය වෙත ලිඛිතව දන්වා යවා ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

IV. මෙම කර්මාන්ත ශාලාව පවත්වාගෙන යනු ලබන අයිතිකරු විසින් සිදු කර ඇති අතීත වැරදි සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් සහිතව මධ්‍යම පරිසර අධිකාරිය දැනුවත් කර තිබේද ?

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කර්මාන්තකරු වෙත මධ්‍යම පරිසරඅධිකාරිය මඟින් නිකුත් කර ඇති CE/17/SA/KE/PDF/20/2022 දරණ පාරිසරික නිර්දේශයේ 10 වන නිර්දේශයට අදාලව මෙම සභාවෙන් ලබා ගත යුත්තේ කුමන

ආකාරයේ අවසරයක්ද යන්න විමසා මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ වෙත 2022.07.27 දිනැතිව ලිපියක් යොමු කර ඇත.

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා:**

**01.(i) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 01 හි දැක්වෙන 2022.07.26 වෙනි දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව පිළිගැනීමට හා එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඇමුණුම: 01

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

**<u>මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභා වාර්තාව</u>**

**දිනය:-**2022.07.26 **වේලාව :- පෙ:ව:** 09.30

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් හා පහත නම් සඳහන් අනෙකුත් සමාජික ගරු මන්ත්‍රී තුමන්ලාගේ සහභාගිත්වයෙන් පැවැති මුදල් හා ප්‍රතිපත්ති කමිටු කාරක සභාවේ වාර්තාවයි.

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා | ගරු සභාපති |
| 02 | විමුක්ති කුමාර ජයරත්න මැතිතුමා | ගරු උප සභාපති |
| 03 | ඩබ්.අබේසේන මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 04 | සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 05 | අමිල කන්දෙආරච්චි මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 06 | සරත් විජේසිරි මැතිතුමා | |
| 07 | එම්.එම්.ෆර්හාන් මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 08 | ලක්මාල් සමරරත්න මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 09 | විකුම් චන්දන කස්තිරගේ මැතිතුමා | ගරු මන්ත්‍රී |
| 10 | සුධර්මා ලක්මාලි මැතිණිය | ගරු මන්ත්‍රීනී |

**කාරක සභාව වෙත ඉදිරිපත් වූ යෝජනා :**

I. ඉන්ධන මිල ගණන් ඉහළ යාම හා රට තුල පවත්නා ඉන්දන හිඟය හේතුවෙන් බොහෝ ත්‍රී රෝද රථ ධාවනයෙන් ඉවත් වී ඇති බවත් එබැවින් අතුරු ව්‍යවස්ථානුකූලව ත්‍රී රෝද රථ ගාල් ගාස්තු අය කිරීම

ගැටළුකාරී තත්වයක්ව පවතින බැවින් පවත්නා තත්වය මත ත්‍රී රෝද රථ ගාස්තු අඩු කිරීම සඳහා උපදෙස් ඉල්ලා විෂය නිලධාරී විසින් කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

සභාවේ ආදායම් මාර්ග බොහොමයක්ද මේ වන විට පවත්නා තත්වයන් තුළ අඩපණව ඇති බැවින් සහ වැඩි වන ඉන්දන මිලට සාපේක්ෂව ත්‍රී රෝද රථ ගාස්තු වැඩි කිරීමට ත්‍රී රෝද රථ රියදුරන් විසින් කටයුතු කරන බැවින් එම ගාස්තු සංශෝධනය කිරීම අනවශ්‍ය බවට කාරක සභා විසින් තීරණය කරන ලදී.

II. මාදොල ගංගානි උද්‍යානයේ පිහිටි ළමා ක්‍රීඩා පිටිය ප්‍රයෝජනයට නොගැනීම මත වල් බිහි වී ඇති බවත් හම නිසා වගා කිරීම සඳහා එම බිම් කොටස ලබා දෙන ලෙස ඉල්ලා A 3, ජනසළු පාර, මාදොල පදිංචි සරත් අබේරත්න මහතා විසින් ලිපියක් ඉදිරිපත් කර ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය උපදෙස් ඉල්ලා අදාල ලිපිය විසය නිලධාරි විසින් කාරක සභාව වෙත යොමු කර තිබුණි.

**තීරණය:**

කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගෙන වගා කිරීම සඳහා අදාල ඉඩමෙන් සුදුසු කොටසක් ලබා දීමට කාරක සභාව තීරණය කරන ලදී.

III. සභාවේ සේවය කරනු ලබන කනිෂ්ඨ සේවක මණ්ඩලයේ මහත්වරුන් විසින් සේවයට කැඳවීමේදී පවතින දුෂ්කරතා සැලකිල්ලට ගෙන ඔවුන්ටද සතියේ දිනවල නිවාඩු ලබා දෙන ලෙස ඉල්ලා සිටින බැවින් ඒ සඳහා අවශ්‍ය උපදෙස් ඉල්ලා විෂය නිලධාරී විසින් කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

ආදාහනාගාර ක්‍රියාකරුවන්, මුරකරුවන්, විදුලි කාර්මික, රියදුරු, සහ රැකියා ලක්ෂයෙන් ස්ථිර පත් වීම් ලබා ඇති සේවක මහත්වරුන් සඳහා අදාල සේවා ස්ථාන වල කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා හැකි වන ලෙස සතියේ දින වල දින වෙන් කර නිවාඩු ලබා දීමට තීරණය කරන ලදී එසේම ඒ ආකාරයෙන් නිවාඩු ලබා දෙන දිනයන් වලට අතිකාල ලබා නොදෙන බවටත් , සෑම කනිෂ්ඨ සේවකයෙකුටම සේවයට වාර්තා කිරීමේදී ඇගිලි සලකුණු තැබීම අනිවාර්ය බව දැන්වීමත් සුදුසු බව තීරණය කරන ලදී.

**iv**. දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් මස් කඩ වලට අදාලව මේ වන විට රට තුළ ඇති වී තිබෙන අර්බුදකාරී තත්වය හේතුවෙන් මාසික කුලිය ගෙවීම අපහසු බැවින් ඒ සඳහා සහනයක් සලසා දෙන ලෙස ඉල්ලා අදාල ව්‍යාපාරිකයන් විසින් ලිපි ඉදිරිපත් කර ඇති බැවින් ඒ සඳහා ගත යුතු ක්‍රියා මාර්ගය පිළිබඳව උපදෙස් ඉල්ලා විෂය නිලධාරී විසින් කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

මාළු වෙළඳසැලෙහි අංක 02 කඩ කාමරයට පමණක් කුලී ගෙවීමට අවසර ඉල්ලා එහි ටෙන්ඩර්කරු විසින් සිදු කරන ලද ඉල්ලීම සලකා බැලූ කාරක සභාව අංක 01 කඩ කාමරය මුදල් ගෙවීම් වලින් නිදහස් කර අංක 02 කඩ කාමරයට පමණක් මුදල් ගෙවීමට අවස්ථාව ලබා දීමට නම් අංක 01 කඩ කාමරය සභාවට නැවත

භාර දිමට කැමතිද යන්න විමසා එසෙ ් එකඟ නම් ඒ කඩ කාමරය නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කරන බවට අදාල ටෙන්ඩර්කරුට ලිඛිතව දන්වා යැවීමට තීරණය කරන ලදී. එසේම ගුරුගල්ල ඌරු මස් කඩය ටෙන්ඩර් කර ලබා දී ඇති බැවින් ඒ ආකාරයට අදාල ඉල්ලීම ඉටු කළ නොහැකි බව තීරණය කරන ලදී.

**v.** 2022.06.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණ වලට අනුව සියළුම ආකාරයේ උත්සව සඳහා රාජ්‍ය මුදල් වැය කිරීම අත්හිටුවා ඇති බැවින් එම උපදෙස් ප්‍රකාරව කටයුතු කරන ලෙස දන්වා පළාත් පාලන කොමසාරිස් විසින් යොමු කරන ලද ලිපිය කාරක සභාව වෙත ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

අදාල ලිපියේ ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

**vi**. දෙහිඕවිට එළු කුකුල් මස් කඩය සඳහා ජල සැපයුම ලබා දි නොමැති බැවින් ජල සම්බන්ධතාවය ලබා දෙන ලෙස ටෙන්ඩර්කරු විසින් ඉල්ලීම් සිදු කර ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ඉල්ලා විෂය නිලධාරී විසින් කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

අදාල ජල සැපයුම කඩිනමින් ලබා දීම සඳහා කාරක සභා අනුමැතිය ලබා දෙන ලදී.

**vii**. දීගලවත්ත ගම හරහා ජල ව්‍යාපෘතිය සිදු කිරීමේදී අදාල ළිඳ පිහිටි ස්ථානයට ළිං වළලු ගැනීමේදී කෞශල්‍යා ප්‍රියන්ති ප්‍රේමසිංහ යන අය විසින් භුක්ති විදින පර්චස් 1/2 ක් වූ ඉඩම් ප්‍රමාණයක පිහිටි තේ ගස් 80 ක් , රබර් ගස් 10 ක, (ආදායම් ලබමින් පවතින) ගලවා ඉවත් කිරීමට සිදු වූ බවත් එලෙස ගලවා ඉවත් කිරීමට සිදු වූ ගස් වෙනුවෙන් අළාභයක් ගෙවන ලෙස ඉල්ලා අදාල ව්‍යාපෘතිය සිදු කළ ගුරුගල්ල ග්‍රාම සංවර්ධන සමි ්තියෙන් යොමු කරන ලද ලිපිය කිරක සභාව වෙත ඉදිරිපත් කර තිබුණි.

**තීරණය:**

සිදු වූ අලාභය වෙනුවට තේ පැළ 100ක් සහ රබර් පැළ 15ක් සභාව මඟින් ලබා දීම සුදුසු බවට තීරණය කරන ලදී.

**viii** . මාගම්මන ආයුර්වේද ගොඩනැඟිල්ල පිහිටි ඉඩමේ තිබෙන අනතුරුදායක මැහෝගනී ගසක් සහ අඹ, රඹුටන්, හිග්, තේක්ක සහ කොට්ටම්බා ගස් කීපයක අතු හේතුවෙන් ගොඩනැඟිල්ලේ වහලයට හානි සිදු වී ඇත. එබැවින් මිල ගණන් කැදවා කැපුම්කරුවෙකු මඟින් මැහෝගනී ගස සම්පූර්ණයෙන් කපා ඉවත් කිරීමට හා අනෙකුත් ගස් වල අනතුරුදායක වන අතු කපා ඉවත් කිරීම සඳහා අනුමැතිය ඉල්ලා විෂය නිලදාරි විසින් කාරක සභාව වෙත ලිපියක් ඉදිරිපත් කර තිබුණි.
**තීරණය:**

මහා සභා අනුමැතියක් ලබා ගෙන ආදාල කාර්ය සිදු කිරිම සුදුසු බවට කාරක සභාව විසින් තීරණය කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සහා සම්මත විය.

**01.(ii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

සභාවේ පොදු කාර්යන් සඳහා වූ වියදම් වෙනුවෙන් ඇමුණුම 02 හි දැක්වෙන 2022 ජූලි මාසයේ මාසික වියදම් සඳහා ගෙවීම් අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඇමුණුම
අංක 02

## දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

2022 ජූලි මස 31 වන දින තෙක් ගෙවීම් වවුචර්පත්

| දිනය | වවුචර්පත් අංකය | විස්තරය | වටිනාකම |
|---|---|---|---|
| ජූලි:04 | 1076 | අයි.ටී.විජේතුංග<br>දෙ/ප්‍රා/සභාවේ කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු කාර්මික නිලධාරී මයාට 2022 ජූනි මස දීමනා ලබා දීම. | 38,199.00 |
| ජූලි:04 | 1077 | මු.හා.ක-එච්.ඒ.ශ්‍යාමනී<br>ගමන් වියදම් ගෙවීම. | 1,253.24 |
| ජූලි:04 | 1078 | මු.හා.ක-ආර්.ජී.එස්.එස්.වික්‍රමාරච්චි<br>ගමන් වියදම් ගෙවීම. | 4,400.00 |
| ජූලි:04 | 1079 | මු.හා.ක-බී.පී.එන්.විජයතුංග<br>RD8018 දරණ ට්‍රැක්ටරයේ ටයර් එක පුරවා ලියවා සවි කිරීම වෙනුවෙන් අතින් වියදම් කල මුදල් ගෙවීම. | 1,700.00 |
| ජූලි:04 | 1080 | මු.හා.ක-ඒ.බී.හේමචන්ද්‍ර<br>බේලර් යන්ත්‍රයේ බේල් ගැසීම සඳහා අවශ්‍ය ස්ට්‍රොපික් ක්ලිප් ලබා ගැනීමට අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 4,500.00 |
| ජූලි:04 | 1081 | මු.හා.ක- ඒ.බී.හේමචන්ද්‍ර<br>කොස් පැළ රෝපණය කිරීමේ වැඩසටහන සඳහා අවශ්‍ය පොලිතින් ලබා ගැනීමට අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 4,440.00 |
| ජූලි:04 | 1082 | නිපෝන් හාඩ්වෙයාර්<br>ජාතික වෙසක් උත්සවයේ සරසිලි සඳහා ලබා ගත් CFL බල්බ වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,800.00 |
| ජූලි:04 | 1083 | නිපෝන් හාඩ්වෙයාර්<br>කාර්යාලීය අවශ්‍යතාවය සඳහා ලබාගත් ද්‍රව්‍ය වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,490.00 |
| ජූලි:04 | 1084 | නිපෝන් හාඩ්වෙයාර්<br>කාර්යාලයේ මල් වගාව සඳහා ජලය සැපයීමට රබර් හෝස් එකක් ලබා ගැනීම වෙනුවෙන් බිල්පත් ගෙවීම. | 3,650.00 |
| ජූලි:04 | 1085 | නිපෝන් හාඩ්වෙයාර්<br>දෙ/පොදු වැසිකිළියේ ජලනල පද්ධතිය අලුත්වැඩියාව සඳහා ලබාගත් උපකරණ වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,270.00 |
| ජූලි:04 | 1086 | නිපෝන් හාඩ්වෙයාර්<br>දෙ/ප්‍රා/සභා කාර්යාලයේ වැසිකිළි පද්ධතියේ අලුත්වැඩියා කටයුතු සඳහා ලබාගත් අමතර උපාංග වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,780.00 |
| ජූලි:04 | 1087 | නිපෝන් හාඩ්වෙයාර්<br>ජාතික වෙසක් උත්සවයේ සරසිලි සඳහා ලබා ගත් ටේප් රෝල් 03ක් වෙනුවෙන් මුදල් ගෙවීම. | 300.00 |

| | | | |
|---|---|---|---|
| ජූලි:04 | 1088 | විහාරකන්ද කීර්ති ශ්‍රී රාජසිංහ වැඩිහිටි සමිතිය<br>පින්නපොල පට්ටියාවත්ත මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ අදියර I රුඳවුම් මුදල් ගෙවීම. | 96,328.64 |
| ජූලි:06 | 1089 | ආනන්ද කේ.කුමාරසිංහ<br>6210/ රිටි නඩුවේ ලේඛණ සැකසීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 15,000.00 |
| ජූලි:06 | 1090 | මු.හා.ක-එච්.ජී.දේශප්‍රිය - 2022 ජූනි මස අතිකාල ගෙවීම. | 11,533.00 |
| ජූලි:06 | 1091 | මු.හා.ක-එච්.පී.පී.සමන් කුමාර - 2022 ජූනි මස අතිකාල ගෙවීම. | 12,095.00 |
| ජූලි:06 | 1092 | මු.හා.ක-ඒ.ජී.දමිඳු ශයිමින්ද - ගමන් වියදම් ගෙවීම. | 6,500.00 |
| ජූලි:06 | 1093 | මු.හා.ක-එච්.පී.පී.සමන් කුමාර - ගමන් වියදම් ගෙවීම. | 4,200.00 |
| ජූලි:06 | 1094 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>දැරණියගල ඩිපෝව මගින් ඩීසල් 100L ක් ලබා ගැනිම සඳහා අවශ්‍ය මුදල් ලබා ගැනීම. | 46,000.00 |
| ජූලි:07 | 1095 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>2022.01.25 හා 2022.05.06 යන දිනයන්හි පැවති තා.ප්‍ර.සමාලෝචන කමිටුව සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ දීමනා ගෙවීම. | 1,700.00 |
| ජූලි:07 | 1096 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>2022 ජනවාරි සිට ජූනි මස දක්වා අධීක්ෂණ හා ලිපි කටයුතු දීමනා ගෙවීම. | 4,500.00 |
| ජූලි:07 | 1097 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>2022.01.25 හා 2022.05.06 යන දිනයන්හි පැවති තා.ප්‍ර.සමාලෝචන කමිටුව සඳහා දීමනා ගෙවීම. | 4,500.00 |
| ජූලි:07 | 1098 | මු.හා.ක-කේ.ජී.සී.වෙරෝනිකා ගම ඇතිගේ<br>2022 ජූනි මස පෙර පාසැල් දීමනා ගෙවීම. | 15,000.00 |
| ජූලි:07 | 1099 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ජූනි මස දෙ/ප්‍රා/සභාවේ කුලී පදනම මත වැටුප් ගෙවීම. | 894,106.31 |
| ජූලි:07 | 1100 | එල්.එම්.කේ.ඩිස්ට්‍රිබියුටර්ස්<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ මැසි උවදුර පාලනය සඳහා ලබාගත් මැසි නාශක සඳහා මුදල් ගෙවීම. | 58,000.00 |
| ජූලි:07 | 1101 | එන්.කරුණාරත්න<br>දෙ/ප්‍රා/සභා කාර්යාල පරිශ්‍රය හා පොදු වෙළඳ සංකීර්ණය පිරිසිදු කිරීම සඳහා 2022 ජූනි මස මුදල් ගෙවීම. | 85,200.00 |
| ජූලි:07 | 1102 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-10/44/018/108/17 දරණ තල්දූව සතිපොළේ 2022 ජනවාරි සිට මැයි මස දක්වා බිල්පත් ගෙවීම. | 77,932.49 |
| ජූලි:08 | 1103 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:798009002 දරණ තල්දූව පුස්තකාලයේ 2022/05/17-2022/06/11 දක්වා බිල්පත ගෙවීම. | 624.30 |
| ජූලි:08 | 1104 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:6321102601 දරණ පනාවල පෙර පාසැල් නව ගොඩනැගිල්ලේ 2022/06/06-2022/06/30 දක්වා බිල්පත ගෙවීම. | 404.70 |

| | | | |
|---|---|---|---|
| ජූලි:08 | 1105 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:7909280106 දරණ ඊරියගොල්ල ආදාහනාගාරයේ 2022/06/04-2022/06/29 දක්වා බිල්පත ගෙවීම. | 2,289.60 |
| ජූලි:08 | 1106 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ:2692684915 දරණ පනාවල මහජන පුස්තකාලයේ 2022/06/06-2022/06/30 දක්වා බිල්පත ගෙවීම. | 240.00 |
| ජූලි:08 | 1107 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2222315 දරණ කාර්යාලීය දුරකථනයේ 2022/05/16-2022/06/15 දක්වා බිල්පත ගෙවීම. | 2,110.28 |
| ජූලි:08 | 1108 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබා දීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ආදායමට ගැනීම.(No Cash) | 20,000.00 |
| ජූලි:08 | 1109 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබා දීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ආදායමට ගැනීම.(No Cash) | 20,000.00 |
| ජූලි:11 | 1110 | මු.හා.ක-එච්.ඒ.ශ්‍යාමනී -ගමන් වියදම් ගෙවීම. | 1,292.00 |
| ජූලි:11 | 1111 | මු.හා.ක-එච්.ඒ. .ශ්‍යාමනී -ගමන් වියදම් ගෙවීම. | 1,292.00 |
| ජූලි:11 | 1112 | මු.හා.ක-එච්.ඒ. .ශ්‍යාමනී -ගමන් වියදම් ගෙවීම. | 1,292.00 |
| ජූලි:11 | 1113 | මු.හා.ක-එච්.ඒ. .ශ්‍යාමනී -ගමන් වියදම් ගෙවීම. | 1,292.00 |
| ජූලි:11 | 1114 | මු.හා.ක-එච්.පී.පී.සමන්කුමාර<br>PF7369 අංක දරණ කැබ් රථය සඳහා දැරණියගල ඩිපෝවෙන් ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 23,000.00 |
| ජූලි:11 | 1115 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>දිගලවත්ත කසල මධ්‍යස්ථානයේ කාබනික පොහොර විකිණීමෙන් ලැබෙන මුදලින් අදාල සේවකයන්ට දිරි දීමනා ලබාදීම. | 20,596.00 |
| ජූලි:11 | 1116 | මු.හා.ක-ඊ.ජී.නිහාල් ලක්සිරි<br>ඉන්ධන සංචිතයේ තබා ගැනීම සඳහා 200L ක බැරලයක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ලබා ගැනීම. | 5,000.00 |
| ජූලි:11 | 1117 | මු.හා.ක-ආර්.ඩී.නලින් පුෂ්පකුමාර<br>දෙ/ප්‍රා/සභාවේ ලේකම් ධුරයේ වැඩ බැලීමට අදාල දීමනාව ගෙවීම.(2022.06.11-2022.07.10 දක්වා) | 10,583.75 |
| ජූලි:11 | 1118 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>2022/07/12 දින පැවැත්වෙන මහා සභා රැස්වීමේ සංග්‍රහ කටයුතු සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 10,000.00 |
| ජූලි:11 | 1119 | බුද්ධික කේ.පියරත්න<br>70326(66) අංක දරණ නඩුව වෙනුවෙන් 2022.05.17 හා 2022.05.31 යන දිනයන්හි පෙනී සිටීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 20,000.00 |
| ජූලි:11 | 1120 | කේ.සුමිත්‍රා දමයන්ති<br>29286/L අංක දරණ නඩුව වෙනුවෙන් 2022.06.24 යන දිනයෙහි පෙනී සිටීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,000.00 |

| | | | |
|---|---|---|---|
| ජූලි:11 | 1121 | කේ.සුමිත්‍රා දමයන්ති<br>29299/L අංක දරණ නඩුව වෙනුවෙන් 2022.06.20 යන දිනයෙහි පෙනී සිටීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,000.00 |
| ජූලි:11 | 1122 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ජූලි මස දෙ/ප්‍රා/සභාවේ සභික දීමනා ගෙවීම. | 795,000.00 |
| ජූලි:11 | 1123 | ඩබ්.එස්.ගෞරි<br>සේවක මහතුන් සඳහා ලබා දීමට ලබාගත් නිල ඇඳුම් රෙදි වෙනුවෙන් බිල්පත් ගෙවීම. | 117,155.00 |
| ජූලි:11 | 1124 | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්-පේරාදෙණිය<br>ගෙවතු වගා වැඩසටහන යටතේ ගෙවතු 450ක් සඳහා බීජ පැකට් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 45,000.00 |
| ජූලි:12 | 1125 | මු.භා.ක-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාව සතු වාහන සඳහා ඩීසල් ලීටර් 250ක් දැරණියගල ඩිපෝවෙන් ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබා දීම. | 115,000.00 |
| ජූලි:14 | 1126 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>2022.06.07 පැවති මහා සභා රැස්වීම වෙනුවෙන් ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම.(No Cash) | 6,995.00 |
| ජූලි:14 | 1127 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>ශ්‍රවණාගාරය කුලියට ලබා දීම වෙනුවෙන් තැන්පත් කල මුදල් ආදායමට ගැනීම.(No Cash) | 20,000.00 |
| ජූලි:14 | 1128 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>දෙ/ප්‍රා/සභාව සතු වාහන සඳහා දැරණියගල ඩිපෝවෙන් ඉන්ධන ලබා ගැනීම සඳහා ලබා ගත් අත්තිකාරම් පියවීම.(No Cash) | 46,000.00 |
| ජූලි:14 | 1129 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>තල්දුව පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට දේශිය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය මුදලේ මුදල හා පොළී මුදල ගෙවීම.(2022 මැයි සඳහා) | 156,136.31 |
| ජූලි:14 | 1130 | දේශීය ණය සහ සංවර්ධන අරමුදල<br>තල්දුව පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීමට දේශිය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගත් ණය මුදලේ මුදල හා පොළී මුදල ගෙවීම.(2022 ජූනි සඳහා) | 156,136.31 |
| ජූලි:14 | 1131 | මධ්‍යම පරිසර අධිකාරිය<br>දෙ/ඊරියගොල්ල ආදාහනාගාරයේ ආරක්ෂණ බලපත්‍රය සඳහා ගාස්තු ගෙවීම. | 12,911.11 |
| ජූලි:14 | 1132 | මු.භා.ක-ආර්.ඩී.නලින් පුෂ්පකුමාර<br>නිවාඩු දින සේවයෙහි දීමනා ගෙවීම. | 8,100.75 |
| ජූලි:15 | 1133 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 57,432.00 |

| | | | |
|---|---|---|---|
| ජූලි:18 | 1134 | දෙබෑගම ගොවි සංවිධානය<br>කොරසවැල්කනේ මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% ගෙවීම. | 99,000.00 |
| ජූලි:18 | 1135 | සැනසුම වැඩිහිටි සමිතිය-පනාවල<br>පනාවල දමුපිටිමුල්ල පාරේ දුශ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ 30% රඳවුම් මුදල් ගෙවීම. | 58,200.00 |
| ජූලි:18 | 1136 | අටුළුගම උතුර ග්‍රාම සංවර්ධන සමිතිය<br>මකුළුවාතැන්න මාර්ගය සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රඳවුම් මුදල් ගෙවීම. | 97,850.00 |
| ජූලි:18 | 1137 | ටයිටස් මනතුංග<br>කෑගල්ල මහාධිකරණයේ 62/0 නඩුවෙහි මුදල් ගෙවීම. | 50,000.00 |
| ජූලි:18 | 1138 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස RD-6441 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 33,294.00 |
| ජූලි:18 | 1139 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස RD-5928 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 37,629.00 |
| ජූලි:18 | 1140 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස RD-6541 දරණ ට්‍රැක්ටරය ට්රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 7,803.00 |
| ජූලි:18 | 1141 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස RC-1403 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 59,015.00 |
| ජූලි:18 | 1142 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස LF-4836 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 12,427.00 |
| ජූලි:18 | 1143 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස බොබ්කැට් යන්ත්‍රය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 62,470.00 |
| ජූලි:18 | 1144 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස LL-7582 දරණ කෘ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 38,437.00 |
| ජූලි:18 | 1145 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 මැයි මස LL-6937 දරණ ටිපර් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 26,299.00 |
| ජූලි:18 | 1146 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>RX1998 දරණ ට්‍රේලරයට රේසර් 02ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,600.00 |
| ජූලි:18 | 1147 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>RC-1403 දරණ ට්‍රැක්ටරයට ෆෑන් බෙල්ට් 01ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,250.00 |

| | | | |
|---|---|---|---|
| ජූලි:18 | 1148 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>RE-2258 දරණ ට්‍රැක්ටරයේ ට්‍රේලරයේ ටිපර් හෝස් එක අලුතින් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,500.00 |
| ජූලි:18 | 1149 | ජාතික රක්ෂණ භාර අරමුදල<br>LF4836 අංක දරණ බොලෙරෝ කැබ් රථය සඳහා රක්ෂණ වාරිකය අලුත්කිරීම වෙනුවෙන් මුදල් ගවීම. | 11,131.90 |
| ජූලි:18 | 1150 | සංජීව ඔටෝ ඉංජිනියරින්<br>LF4836 කැබ් රථයේ ඉදිරිපස මූණ හා පිටුපස තට්ටුව අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 183,000.00 |
| ජූලි:18 | 1151 | ආටිගල සහ පුත්‍රයෝ<br>RE2258 අංක දරණ ට්‍රැක්ටරයේ ට්රේලරයේ ටිපර් පොම්පයට ඔයිල් සීල් දැමීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,200.00 |
| ජූලි:19 | 1152 | මු.හා.ක-යූ.එල්.ජී.ජයතිලක -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 3,988.00 |
| ජූලි:19 | 1153 | මු.හා.ක-එච්.ආර්.කේ.ජයවර්ධන -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 8,166.00 |
| ජූලි:19 | 1154 | මු.හා.ක-ආර්.ඩී.සී.කරුණාරත්න -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 4,500.00 |
| ජූලි:19 | 1155 | මු.හා.ක-එම්.එල්.ඒ.කුමාර -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 4,041.00 |
| ජූලි:19 | 1156 | මු.හා.ක-අයි.ඩී.ඩබ්.එස්.කුමාර -2022 මැයි මස අතිකාල ගෙවීම. | 2,632.00 |
| ජූලි:19 | 1157 | මු.හා.ක-අයි.ඩී.ඩබ්.එස්.කුමාර -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 1,717.00 |
| ජූලි:19 | 1158 | මු.හා.ක-එම්.ආර්.පී.කුමාරසිරි -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 6,500.00 |
| ජූලි:19 | 1159 | මු.හා.ක-එච්.එම්.එස්.නන්දකුමාර -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 4,523.00 |
| ජූලි:19 | 1160 | මු.හා.ක-එන්.ජී.ආර්.ටී.ගුණරත්න -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 4,208.00 |
| ජූලි:19 | 1161 | මු.හා.ක-එස්.පී.තිලකරත්න -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 6,528.00 |
| ජූලි:19 | 1162 | මු.හා.ක-ආර්.ජී.එස්.ඩී.රොෂාන්ත -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 8,333.00 |
| ජූලි:19 | 1163 | මු.හා.ක-පී.ජී.සෙනවිරත්න -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 9,000.00 |
| ජූලි:19 | 1164 | මු.හා.ක-ඩී.එල්.ආර්.එස්.කුමාර -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 8,049.00 |
| ජූලි:19 | 1165 | මු.හා.ක-ඩබ්.ඒ.ඩී.කොඩිකාර -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 8,466.00 |
| ජූලි:19 | 1166 | මු.හා.ක-බී.පී.එන්.විජේතුංග -2022 ජූනි මස අතිකාල ගෙවීම. | 6,838.00 |
| ජූලි:19 | 1167 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>PF7369 අංක දරණ කැබ් රථයට සහ ට්‍රැක්ටර් රථ සඳහා සැපයීමට ඉන්ධන ලීටර් 150 ක් ලබා ගැනීමට අත්තිකාරම් මුදල් ලබා දීම. | 66,000.00 |
| ජූලි:20 | 1168 | කෑගල්ල ඩිස්ට්‍රිබියුටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්<br>ඊ/ආදාහනාගාරයට ගෑස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 76,576.00 |
| ජූලි:21 | 1169 | සී.එම්.පී.රුවන් කුමාර<br>කාර්යාලීය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,750.00 |
| ජූලි:21 | 1170 | සී.එම්.පී.රුවන් කුමාර<br>කාර්යාලීය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 885.00 |

| | | | |
|---|---|---|---|
| ජූලි:21 | 1171 | එස්.එච්.එම්.ඉර්ෂාන්<br>දෙ/ප්‍රා/සභාවේ අවශ්‍යතාවය සඳහා ලබා ගත් විදුලි හීටරය වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,450.00 |
| ජූලි:21 | 1172 | එස්.එච්.එම්.ඉර්ෂාන්<br>ප්‍රා/සභා කාර්යාල රාත්‍රී මුරකරු සඳහා විදුලි පන්දමක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 1,450.00 |
| ජූලි:21 | 1173 | දාස මෝටර්ස්<br>RX1998 දරණ ට්‍රේලරයේ රේසර් අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 13,300.00 |
| ජූලි:21 | 1174 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්<br>2022 වර්ෂයේ ජනවාරි,පෙබරවාරි සහ මාර්තු මාස සඳහා විශ්‍රාම වැටුප් දායක බිල්පත් ගෙවීම. | 10,334.79 |
| ජූලි:21 | 1175 | කොලොන්න සර්විස් සෙන්ටර්<br>RD9461 දරණ ට්‍රැක්ටරය සේවා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 27,620.00 |
| ජූලි:21 | 1176 | නිපොන් හාඩ්වෙයාර්<br>ප්‍රිමික්ස් අංගනයේ අවශ්‍යතාවය සඳහා ප්ලේට් 01ක් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 234,000.00 |
| ජූලි:22 | 1177 | ලේකම්-දෙ/ප්‍රා/සභාව<br>2022 ජූලි මස දෙ/ප්‍රා/සභාවේ ස්ථිර සේවක වැටුප් ගෙවීම. | 3,257,412.44 |
| ජූලි:25 | 1178 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-10/44/018/108/17 දරණ තල්දූව සතිපොළේ 2022 මැයි මස සිට බිල්පත් ගෙවිම. | 42,443.98 |
| ජූලි:25 | 1179 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/067/174/14 දරණ රී/ආදාහනාගාරයේ 2022/05/23-2022/06/23 දක්වා බිල්පත ගෙවිම. | 448.19 |
| ජූලි:25 | 1180 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/035/18 දරණ දෙ/ පොදු ජල කණුවේ 2022/06/08-2022/07/11 දක්වා බිල්පත ගෙවිම. | 319.20 |
| ජූලි:25 | 1181 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/054/16 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/06/03-2022/07/04 දක්වා බිල්පත ගෙවිම. | 2,975.09 |
| ජූලි:25 | 1182 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/002/073/13 දරණ දෙහිඕවිට පොදු ජල කණුවේ 2022/06/04-2022/07/05 දක්වා බිල්පත ගෙවිම. | 434.93 |
| ජූලි:25 | 1183 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/068/152/18 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/05/26-2022/06/26 දක්වා බිල්පත ගෙවිම. | 318.27 |
| ජූලි:25 | 1184 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය<br>ගි:අ:-25/04/003/001/18 දරණ දෙහිඕවිට පැරණි ප්‍රා/සභා කාර්යාලයේ 2022/06/04-2022/07/04 දක්වා බිල්පත ගෙවිම. | 4,845.87 |

| | | | |
|---|---|---|---|
| ජූලි:25 | 1185 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි. අ.7991368912 දරණ මාගම්මන ආයුර්වේදයේ 2022/05/21 සිට 2022/06/18 දක්වා බිල්පත ගෙවීම. | 825.60 |
| ජූලි:25 | 1186 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7970101003 දරණ දෙ/නව ප්‍රා/සභා කාර්යාලයේ 2022 ජූනි මස බිල්පත ගෙවීම. | 46,253.60 |
| ජූලි:25 | 1187 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7921106404 දරණ දෙ/ම/පුස්තකාලයේ(E-library) 2022/06/15-2022/07/16 දක්වා බිල්පත ගෙවීම. | 1,228.20 |
| ජූලි:25 | 1188 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි:අ: 7991487016 දරණ දෙ/පැරණි සභාවේ 2022/06/03-2022/07/12 දක්වා බිල්පත ගෙවීම. | 1,850.40 |
| ජූලි:25 | 1189 | සාමාන්‍යාධිකාරී ලංකා විදුලි බල මණ්ඩලය<br>ගි.අ.7918009002 දරණ තල්දූව පුස්තකාලයේ 2022/06/11 සිට 2022/07/14 දක්වා බිල්පත ගෙවීම. | 697.50 |
| ජූලි:25 | 1190 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ඊරියගොල්ල ආදාහනාගාරයේ 036-3868934 දරණ දුරකතනයේ 2022/05/16-2022/06/15 දක්වා බිල්පත ගෙවීම. | 524.42 |
| ජූලි:25 | 1191 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු:අ:-036-2222575 දරණ කාර්යාලීය දුරකථනයේ 2022 ජූනි මස බිල්පත ගෙවීම. | 8,618.56 |
| ජූලි:25 | 1192 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123537 දරණ WIFI රවුටරයේ 2022 ජූනි මස බිල්පත ගෙවීම. | 845.71 |
| ජූලි:25 | 1193 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>දු. අ.036-2222534 දරණ ගරු සභාපතිතුමාගේ කාර්යාලීය දුරකතනයේ 2022 ජූනි මස බිල්පත ගෙවීම. | 8,068.28 |
| ජූලි:25 | 1194 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123540 දරණ WIFI රවුටරයේ 2022 ජූනි මස බිල්පත ගෙවීම. | 845.71 |
| ජූලි:25 | 1195 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123538 දරණ WIFI රවුටරයේ 2022 ජූනි මස බිල්පත ගෙවීම. | 845.71 |
| ජූලි:25 | 1196 | ශ්‍රී ලංකා ටෙලිකොම්<br>ගි.අ.94363123539 දරණ WIFI රවුටරයේ 2022 ජූනි මස බිල්පත ගෙවීම. | 845.71 |
| ජූලි:25 | 1197 | මු.හා.ක-ඩී.පී.ටී.පී.විමලසේන<br>දෙ/ප්‍රා/සභාව හා මහජන පුස්තකාලය එක්ව පැවැත්වූ අත්කම් නිර්මාණ තරඟයේ වැඩකටයුතු සඳහා අතින් වියදම් කල මුදල් ලබා ගැනීම. | 1,410.00 |
| ජූලි:25 | 1198 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>නිවාඩු දින සේවයෙහි දීමනා ගෙවීම. | 4,786.00 |

| | | | |
|---|---|---|---|
| ජූලි:25 | 1199 | මු.හා.ක-ආර්.ඒ.යූ.එන්.රණසිංහ<br>2022 ජූනි මස ගමන් වියදම් ගෙවීම. | 3,500.00 |
| ජූලි:25 | 1200 | මු.හා.ක-දෙ/ප්‍රා/සභාව<br>ZA0126 හා RA7673 අංක දරණ වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබාගැනීමට අත්තිකාරම් මුදල් ලබා ගැනීම. | 10,000.00 |
| ජූලි:26 | 1201 | එකමුතු වැඩිහිටි සංවිධානය-ඉහළ තල්දූව<br>යෝගම ආදර්ශ විද්‍යාලයේ පාසැල් ගොඩනැගිලි වහල අලුත්වැඩියා කිරීම කර්මාන්තයේ ඉතිරි මුදල් ගෙවීම. | 873,645.31 |
| ජූලි:28 | 1202 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>2235101 දරණ පොදු ගිණුමට ස්ථාවර තැන්පතු නිදහස් කිරීම.(No Cash) | 2,074,269.43 |
| ජූලි:28 | 1203 | යුනික් මෝටර්ස්<br>250-4053 අංක දරණ කැබ් රථය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 61,240.00 |
| ජූලි:28 | 1204 | සෙනොක් ට්‍රේඩ් කම්බයින් ප්‍රයිවට් ලිමිටඩ්<br>ZA0126 දරණ JCB යන්ත්‍රයට අමතර කොටස් ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 120,841.20 |
| ජූලි:28 | 1205 | ඒ.ඩී.චන්ද්‍රසේන<br>2022 වර්ෂයේ මැයි මස තල්දූව මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 6,850.00 |
| ජූලි:28 | 1206 | ඒ.ඩී. චන්ද්‍රසේන<br>2022 වර්ෂයේ ජූනි මස තල්දූව මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 4,250.00 |
| ජූලි:28 | 1207 | එම්.එච්.ඩී.එස්.සුගතපාල<br>2022 වර්ෂයේ මැයි මස මාගම්මන මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,720.00 |
| ජූලි:28 | 1208 | එම්.එච්.ඩී.එස්.සුගතපාල<br>2022 වර්ෂයේ ජූනි මස මාගම්මන මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 2,250.00 |
| ජූලි:28 | 1209 | කේ.ඒ.පී.කුරුප්පු<br>2022 වර්ෂයේ ජූනි මස පනාවල මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 3,710.00 |
| ජූලි:28 | 1210 | කේ.ඒ.පී.කුරුප්පු<br>2022 වර්ෂයේ මැයි මස පනාවල මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,040.00 |
| ජූලි:28 | 1211 | ඩබ්.ඒ.විකුම් ආනන්ද<br>2022 වර්ෂයේ මැයි මස දෙහිඕවිට මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,830.00 |
| ජූලි:28 | 1212 | ඩබ්.ඒ.විකුම් ආනන්ද<br>2022 වර්ෂයේ ජූනි මස දෙහිඕවිට මහජන පුස්තකාලයට ලබාගත් පුවත්පත් වෙනුවෙන් මුදල් ගෙවීම. | 9,300.00 |

| | | | |
|---|---|---|---|
| ජූලි:28 | 1213 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස RE-2258 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 45,000.00 |
| ජූලි:28 | 1214 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස RD-5928 දරණ ට්‍රැක්ටරය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 57,200.00 |
| ජූලි:28 | 1215 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස PF-7369 දරණ කැබ් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 183,000.00 |
| ජූලි:28 | 1216 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස ZA0126 දරණ JCB යන්ත්‍රය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 94,000.00 |
| ජූලි:28 | 1217 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස භූමිතෙල් ලබාගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 17,400.00 |
| ජූලි:28 | 1218 | කේ.කේ.ඒ.ආර්. කුමාරසිංහ<br>2022 ජූනි මස 42-7498 ගිලන් රථය සඳහා ඉන්ධන සැපයීම වෙනුවෙන් මුදල් ගෙවීම. | 10,000.00 |
| ජූලි:29 | 1219 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>චෙක්පත් අහරු වීමේ ගාස්තුව ගිණුම් තැබීම.(No Cash) | 200.00 |
| ජූලි:29 | 1220 | සභාපති-දෙ/ප්‍රා/සභාව<br>අහරු චෙක්පත් ගිණුම්ගත කිරීම.(No Cash) | 149,360.00 |
| | | **එකතුව** | **11,555,670.79** |

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01.(iii) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මෙම සභාවේ සේවා ගිවිසුම් මත සේවය කරනු ලබන පහත නම් සඳහන් සේවක මහතුන්ගේ ගිවිසුම්ගත කාලය ඉදිරි වර්ෂයක කාලයක් සඳහා නැවත දීර්ඝ කිරීම සුදුසු බව යෝජනා කරමි.

| අනු අංකය | සේවකයාගේ නම | තනතුර | සේවා ගිවිසුම අවසන් වන දිනය |
|---|---|---|---|
| 01 | කේ.ජයතිලක මහතා | සෞඛ්‍ය කම්කරු | 2022.08.12. |
| 02 | බී.ආර්.ජයන්ත මහතා | සෞඛ්‍ය කම්කරු | 2022.09.03. |
| 03 | එම්.කේ.පී.ජනක කුමාර මහතා | සෞඛ්‍ය කම්කරු | 2022.09.02. |
| 04 | එච්.ඩබ්.සමන්කුමාර මහතා | සෞඛ්‍ය කම්කරු | 2022.08.22. |
| 05 | ඩබ්තඩී.එස්.සී.රණසිංහ මහතා | රියදුරු | 2022.09.10 |

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුෂාර සංජීව මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (iv) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවට අයත් මාගම්මන ආයුර්වේද බෙහෙත් ශාලාව පිහිටි ගොඩනැඟිල්ල සහිත භූමියේ තිබෙන අනතුරුදායක මැහෝගනී ගසක් සහ අඹ, රඹුටන්, හිග්, තේක්ක සහ කොට්ටම්බා ගස් කීපයක අතු හේතුවෙන් ගොඩනැඟිල්ලේ වහලයට හානි සිදු වී ඇත. එබැවින් මිල ගණන් කැඳවා කැපුම්කරුවෙකු මඟින් මැහෝගනී ගස සම්පූර්ණයෙන් කපා ඉවත් කිරීමට හා අනෙකුත් ගස් වල අනතුරුදායක වන අතු කපා ඉවත් කිරීම සුදුසු බව යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නීතා බාලසූරිය මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

මෙම යෝජනාවේ මැහෝගනී ගස කපා ඉවත් කිරීමට යෝජනා කර ඇතත් ශාකයක් සම්පූර්ණයෙන්ම කපා ඉවත් කිරීමට පෙර එහි අතු කපා එම අනතුරුදායක තත්වය මඟහරවා ගත හැකි නම් ඒ සඳහා යොමු වීම කාලෝචිත බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

වැසි දින වලදී සේවකයන් එම ගොඩනැඟිල්ල තුළ සිටින විට එය අනාරක්ෂිත තත්වයකට පත් වන බැවින් ගස කපා ඉවත් නොකර ගොඩනැඟිල්ලේ වහලයට අනතුරුදායක ලෙස ඇති අතු පමණක් කපා ඉවත් කරන ලෙසත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මිල ගණන් කැඳවා කැපුම්කරුවෙකු මඟින් එම ගස් වල අනතුරුදායක වන අතු කපා ඉවත් කිරීම යනුවෙන් එම යෝජනාව සංශෝධනය කරන ලදී.

සංශෝධිත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**01 (v) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව 2017.06.28 වෙනි දින එවකට පැවති කළමනාකරණ කමිටුවවේ තීරණ අංක 2493 යටතේ අනුමත කරවා ගෙන ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට තීරණය කර එම අතුරු ව්‍යවස්ථාව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමේදී ඒ සඳහා මහා සභා අනුමැතියක් ලබා ගත යුතු බැවින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය හා එකී පනතේ 126 (vii) (ඊ) වගන්තිය මඟින් සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව සකස් කරන ලද දෙහිඕවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුලත ප්‍රචාරක දැන්වීම් විධිමත් කිරීම, අධීක්ෂණය හා පාලනය පිළිබදව අතුරු ව්‍යවස්ථාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බව යෝජනා කරමි. (ඇමුණුම 03)

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**කල් දී නොමැති යෝජනා:**

**02.(i) ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

දෙහිඕවිට ප්‍රාදේශීය සභාව සතු මාගම්මන කනත්ත භූමියේ තිබෙන අජීවී තත්වයට පත්ව ඇති කොස් ගස් දෙකක් යාබද ඉඩමේ පිහිටි පී.කේ.තිලකසිරි මහතාගේ ලී මෝලට අනතුරුදායක තත්වයේ පවතින බැවින් එම කොස් ගස් දෙක ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීමට 2022.06.07 මහා සභාවේදි අනුමැතිය ලබා දෙන ලදී. එසේ වුවද ඒ සඳහා කිසිදු ගැනුම්කරුවෙකු විසින් ලංසුපත් ඉදිරිපත් කර නොතිබුණි. එම කොස් ගස් දෙක දැනට පවතින තත්වය මත යාබද ඉඩමේ පිහිටි ගොඩනැගිල්ලට අනතුරුදායක මට්ටමක පවතින බැවින් සහ ගස් දෙක දිරා යාම හේතුවෙන් ඒ සඳහා වන ලංසු මුදල සංශෝධනය කර පහත සඳහන් මිල ගණන් තක්සේරුවේ අවම ලංසු මුදල ලෙස පිළිගැනීම සුදුසු බව යෝජනා කරමි. (මෙම යෝජනාව ගරු සභාපතිතුමාට අමතරව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී, ඩබ්.අබේසේන මැතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ටී.ආර්. ලක්මාල් සමරරත්න මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී සඳමාලි සෙනවිරත්න මැතිණිය විසින් අත්සන් කර භාර දී ඇත)

- ❖ අඩි 06 ක් වූ වට ප්‍රමාණයක් සහිත කොස් ගස - රු.25,000.00
- ❖ අඩි 04 ක් වූ වට ප්‍රමාණයක් සහිත කොස් ගස - රු.8,000.00

මෙම යෝජනාව ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

යෝජනාව බෙදීමකින් තොරව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභා වාර්තා සලකා බැලීම:**

2022.07.26 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව, 2022.07.26 දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව, 2022.070.26 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තාව, 2022.06.21 දින පැවති කාර්මික හි සේවා කාරක සභා වාර්තාව සහ 2022.07.26 දින පැවති ප්‍රසම්පාදන කාරක සභා වාර්තාව සලකා බලන ලදී.

(උ) 2022 ජූලි මාසයට අදාල එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව හා වියදම් විස්තරය සලකා බලන ලදී.

**(උ) වෙනත් කරුණු:**

සභාවට දන්වා නොපැමිණි මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අනුමත කිරීම:

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.අබේසේන මැතිතුමා:**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමා සහ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී දිස්නා කුමාරි මැතිණිය අසනිප තත්වයන් හේතුවෙන් අද දින සභාවට නොපැමිණෙන බව දන්වා ඇති බැවින් ඔවුන් සඳහා නිවාඩු අනුමත කිරීම සුදුසු බව යෝජනා කර සිටියේය.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වික්ටර් බණ්ඩාර මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී දිස්නා කුමාරි මැතිණියගේ අසනිප නිවාඩු සඳහා මහා සභා අනුමැතිය හිමි විය.

**ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ මන්ත්‍රීතුමියන්ලාගේ අදහස් ඉදිරිපත් කිරීම:**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය:**

පසුගිය 17 වෙනි දින අනුරාධපුර මහ නගර සභාවේ කාන්තා මන්ත්‍රීවරියකට සිදු කරන ලද පහර දීම මේ සභාව නියෝජනය කරනු ලබන කාන්තා මන්ත්‍රීවරියක් වශයෙන් තමන් දැඩිව හෙලා දකින බව පවසා සිටියාය. පහරකෑමට ලක් වූ එම කාන්තා මන්ත්‍රීවරිය අසාධාරණයට විරුද්ධව හඬක් නැඟූ අයෙකු බවත් එදා එතුමියට සිදු වූ දෙය ඉදිරියේදී වෙනත් සභාවක මන්ත්‍රීවරියකටද සිදු විය හැකි බැවින් එය වළක්වා ගැනීමට කටයුතු කළ යුතු බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

අනුරාධපුරයේ මන්ත්‍රීතුමියට සිදු පහරදීම යම් ආකාරයක වැරදි දෙයක් විය හැකි බවත් නමුත් අපේ රටේ සමස්ථ කාන්තා පක්ෂයටම සිදු වූ අසාධාරණයක් සම්බන්ධයෙන් අද දින සභාවේ අවධානය යොමු කිරීමට අදහස් කළ බව පැවසීය. අද වන විට අප පක්ෂය නියෝජනය කරනු ලබන නායකයා මේ රටේ ජනාධිපති ලෙස පත් වී ඇති බවත් එතුමා පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයන්ගේ ඡන්දයෙන් ජනාධිපති ලෙස තේරී පත් වුවත් මේ රට තුළ පවතින දෙමුහුන් ප්‍රතිපත්තිය හේතුවෙන් පාර්ලිමේන්තුවේ බහුතර බලය හිමි පුද්ගලයින් පිටුපස සිට මෙය මෙහෙය වන බව පවසා සිටියේය. මේ වන විට අප රටේ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට පිටින් රටේ රාජ්‍ය බලය අල්ලා ගැනීමේ කුමන්ත්‍රණයක් සිදු වන බවත් එය මර්ධනය කිරීමට ත්‍රිවිධ හමුදාව හා පොලසිය ශක්තිමත් කළ යුතු බවට කතිකාවතක් මේ දිනවල ඇති වී තිබෙන බව පැවසූ එතුමා එය තමන්ද අනුමත කරන බව පවසා සිටියේය. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට පිටින් කවුරුන් හෝ රාජ්‍ය බලය අල්ලා ගැනීමට උත්සාහ කරන්නේ නම් එය නැවැත්වීමට ආරක්ෂක අංශ වලට පූර්ණ බලතල තිබෙන බව පැවසීය. නමුත් ඒ අවසරයෙන් මේ රට බංකොලොත් කළ මේ රටේ ධනය මංකොල්ල කන ලද මංකොල්ලකරුවන්ට නිසි දඬුවම් ලබා නොදී නියම අපරාධකරුවන් නිදැල්ලේ සිටියදී අප රටේ පීඩාවට පත් වී සිටින ජනතාව වෙනුවෙන් එම අපරාධකරුවන් සම්බන්ධයෙන් ලොවට එළි කළ පිරිස හා වර්තමාන අරගල භූමියේ සිටින තරුණ පිරිස දඟ ගෙට යැවීමට තරම් මේ ආණ්ඩුවට තිබෙන සදාචාරාත්මක අයිතිය කුමක්ද යන්න විමසා සිටියේය.

(ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.01)

එම නිසා රජයේ බලධාරීන්ට ඉදිරිය බොහෝ බියකරු බව පැවසිය යුතු බව පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එය ඔබතුමාගේ පක්ෂය නියෝජනය කරනු ලබන වර්තමාන ජනාධිපතිවරයා වෙත දන්වා සිටීම සුදුසු බව පැවසීය.

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

පසුගිය කාලයේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ මුහුණු වල හිනාවක් දැකීමට නොතිබූ බවත් මේ ආකාරයෙන් සිනහා වීම සතුටට කරුණක් බවත් පවසා සිටියේය. තමන් එදා මෙදා තුර දේශපාලන ඉතිහාසයේ දුටු දක්ෂතම පාලකයෙක් ලෙස ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා හඳුන්වා දෙන බවත් එය අවිවාදයෙන් පිළිගත යුතු කරුණක් බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.03)

කෙසේවෙතත් මේ රට නැවත ලේ විලක් බවට පත් කිරීමට කටයුතු නොකරන ලෙස මේ රටේ පාලකයන්ගෙන් නැවත් වරක් ඉල්ලා සිටින බව පැවසූ එතුමා ලක්ෂ 55 කට වැඩි පවුල් වල ජනතාව ජූලි 09 වෙනි දින මහ පාරට බැස ජනාධිපති මන්දිරය, ජනාධිපති ලේකම් කාර්යාලය, අරලිය ගහ මන්දිරය, ආදී ස්ථාන ජනතා අයිතියට අත්පත් කර ගනු ලැබුවේ කුමන හේතුව නිසාද යන්න විමසා බැලිය යුතු බව පැවසීය. ඒ අනුව ගෙවී ගිය කාලය පුරාවටම රාජපක්ෂ ආණ්ඩු ජනතාවට දරා ගත නොහැකි ආකාරයේ ප්‍රශ්න පීඩා ඇති කරමින් ජනතාව අසරණ තත්වයට පත් කළ බවත් එහි ප්‍රතිඵලයක් ලෙස මෙය සිදු වූ බව පෙන්වා දෙන ලදී. එසේම අද වන විට මේ රටේ ගොවි ජනතාවට පොහොර නොමැති වීම මත සාර්ථක අස්වැන්නක් ලබා ගැනීමට අවස්ථාව අහිමි වී තිබෙන බවත් එලෙස ලබා ගත් අස්වැන්නද වෙළඳපොළට ගෙන යාම ඇති වී තිබෙන ඉන්ධන ප්‍රශ්නය හේතුවෙන් විශාල අභියෝගයක් බවට පත්ව ඇති බවත් පැවසූ එතුමා කෙසේ හෝ අද වන විට ආහාර වේල් තුන ලබා ගැනීමත් මේ රටේ සාමාන්‍ය ජනතාවට විශාල අභියෝගයක් බවට පත්ව ඇති බව පෙන්වා දෙන ලදී. යහපාලන රජය අවසන් වන විට පැවති භාණ්ඩ මිල හා සැසදීමේදී අද වන විට ඇතැම් භාණ්ඩ වල මිල 300% , 500% දක්වා වර්ධනය වී ඇති බවත් පැවසූ එතුමා මේ සිදු වීම මත ජාත්‍යාන්තර මාධ්‍ය ලංකාව ඉන්ධන සැපයීම අත්හිටුවයි යනුවෙන් ප්‍රවෘත්ති විකාශය කළ බව පවසා සිටියේය. පසුගිය ජූලි 25 වෙනි දින ඩොලර් මිලියන 1000 ක ස්වෛරී බැඳුම්කරයක් මේ රටට ගෙවීමට සිදු වූ නමුත් එය ගෙවීමට නොහැකි තත්වයට මේ රට බංකොලොත් වී ඇති බැවින් අද වන විට එම මුදලින් රුපියල් මිලියන 250ක් ඇති බැංකුවක් මේ රටට විරුද්ධව නඩු මහට පිවිස ඇති බවත් පැවසූ එතුමා එම බැංකුව මඟින් රාජපක්ෂවරු මේ රටෙන් කොල්ල කන ලද ධනය විදේශයන් වල රතු පාරාදීයන්ගේ තැන්පත් කර ඇති බැවින් තම රටට හිමි විය යුතු ධනය ලබා දිය යුතු බවත් ණය ප්‍රතිව්‍යුහගත කිරීමට ඔවුන් එකඟ නොවන බවත් ප්‍රකාශ කර ඇති බව පැවසීය. ඒ අනුව බලන විට මුළු ලෝකයම අද වන විට පසුගිය කාලයේ මේ රට පාලනය කළ පාලකයන්ට දෝෂාරෝපණය කරන බවත් ඔවුන් හොරකම් කිරීම හේතුවෙන් මේ තත්වය උද්ගත වී ඇති බව පවසන බවත් පෙන්වා දෙන ලදී.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

දැනුත් රට පාලනය කරනු ලබන්නේ හොරුන් විසින් බවත් එදා මෙදාතුර මේ රට පාලනය කළ සියළුම පිරිස් හොරුන් බවත් පවසා සිටියේය.

**ගරු ප්රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

එය සත්‍යක් නම් අද වන විට සිටින්නේ ඒ පුද්ගලයන්ගේ කුඩා කණ්ඩායම බව පවසා සිටින ලදී.

**ගරු ප්රාදේශීය සභා මන්ත්‍රීනී සඳමාලි විජේරත්න මැතිණිය:**

රාජ්‍ය සේවකයාගේ සිට සියළුම පුද්ගලයන් හොරු බව පැවසුවාය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා:**

ගරු මන්ත්‍රීනී සඳමාලි සෙනවිරත්න මැතිණිය සිදු කළ ප්‍රකාශය සභා වාර්තාවට අනිවාර්යයෙන්ම ඇතුලත් කරන ලෙස ඉල්ලා සිටියේය. අද වන විට තමන් අතින් සිදු වූ අතපසුවීම් හා ගනු ලැබූ ඇතැම් තීරණ හමුවේ රටේ මෙවැනි තත්වයක් උද්ගත වූ බව පිළිනොගනිමින් ඇතැම් නායකයන් මෙය ඔවුන් විසින් සිදු කරන ලද අර්බුදයක් නොවන බවත් 1948 වර්ෂයේ සිට මේ දක්වා මේ රට පාලනය කළ සියළුම නායකයන් මේ සඳහා වග කිව යුතු බවට ඔවුන් විසින් ප්‍රකාශ කරන බව පැවසීය. එසේ නම් යහපාලන කාලයේ ජපානය කොරියාව වැනි මිත්‍ර රටවලින් දශම එකේ පොළියට දිගුකාලීනව ගෙවීමේ පදනම මත ලබා දුන් කඩුවෙල කොළඹ සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘති හතර ,කැළණිවැලි දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩපිළිවෙල, හෝමාගම රථවාහන ගමනාගමන ව්‍යාපෘතිය, තාක්ෂණ නගර ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘති සිදු කළා නම් අද වන විට මේ රට තුළට ඩොලර් අර්බුදයක් උද්ගත නොවනු ඇති බව පැවසූ එතුමා ඒ ආකාරයේ ව්‍යාපෘති අප රටට ලබා දිමට ක්‍රියා කළ මිත්‍ර රටවල් අමනාප කරගෙන සිදු කළ මේ අපරාදයට රාජපක්ෂ පරපුර මේ රටින් සමාව ගත යුතු බව පවසා සිටින ලදී. මේ රටේ කඩා වැටෙන ව්‍යාපාර වලට , බංකොලොත් වන සියළු දේට වගකිව යුත්තේ මේ රටේ ලක්ෂ 222ක ජනතාවට පවුල් ලක්ෂ 55 කට බොහෙත් කිරි පිටි නොමැතිව දුක් විඳීමටට සිදුව ඇත්තේත් වසර 300 කට රාජපක්ෂ වරු මේ රටේ ධනය මංකොල්ල කෑ නිසා බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.14)

ඉන්දියාවේ ප්‍රසිද්ධ ඒ.එන්.අයි.ප්‍රවෘත්ති සේවය අපේ රටේ කාන්තාවන් සම්බන්ධයෙන් ඉතාමත් කණගාටුදායක ප්‍රවෘත්තියක් පසුගිය දා ප්‍රසිද්ධ කළ බව පැවසූ එතුමා අද වන විට මේ රටේ රැකියා අහිමි වීම , ආදායම් මාර්ග අහිමි වීම, ආදි ගැටළු වැඩි වීම හේතුවෙන් දිනෙන් දින ලංකාවේ කාන්තාවන් ලිංගික වෙළදාමට යොමු වන බවටත් ඒ අනුව ලංකාවේ ගණිකා ව්‍යාපාරය පසුගිය මාස කීපය තුළ 30% කින් ඉහල ගොස් ඇති බවට එම ප්‍රවෘත්ති සේවය මගින් සිදු කර ඇති සමීක්ෂණයකින් සොයාගෙන ඇති බව පැවසීය. මෙය ඉතාමත් සංවේදී කාරණාවක් බවත් තම දරුවන් බත් ටිකක්, කිරි පිටි ටිකක් ඉල්ලන අවස්ථාවේදී ඒවා ලබා දීමට නොහැකිව අසරණ තත්වයට පත් වීම මත මේ කාන්තාවන් අකමැත්තෙන් වුවත් මේ වන තත්වයට පත්ව ඇති බව පෙන්වා දෙන ලදී. සිංහල බෞද්ධ සංස්කෘතික පසුබිමක හැදී වැඩෙන අප සියළුදෙනාට මේ අත්දැකීම් කිසිදු දිනක මුහුණ දීමට සිදු වූ ඒවා නොවන බවත් මෙය රටේ සංස්කෘතිය විනාශ වීමට මෙන්ම විවිධ ලෙඩ රෝග බෝ වීමටද මෙය හේතු වන බැවින් මෙය ඉතාමත් කණගාටුදායක තත්වයක් බව පවසා සිටියේය. ආමරිකාවේ සිටි ජනාධිපතිවරයෙකු වූ රොනල්ඩ් රේගන් මහතා වරක සිදු කළ ප්‍රකාශයක් සිහිපත් කළ එතුමා ලොව පැරණිම වෘත්තිය ගණිකා වෘත්තිය බවත් දෙවැන්න දේශපාලනය බවත්

දේශපාලන භූමිකාව තුළදී එය පළමු රැකියාවට අතිශයින් සමාන බවට තමන්ට වැටහුණු බව රොනල්ඩ් රේගන් ජනාධිපතිවරයා ප්‍රකාශ කළ බව පවසා සිටියේය. එම නිසා අප රටේ ජනතාව තවදුරටත් පීඩවට පත් කිරීමට කටයුතු කරනු ලබන මෙම තක්කඩි දේශපාලකයන් පන්නා දැමීම අනිවාර්යයෙන්ම සිදු කළ යුතු බව පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රිනී නයනා ප්‍රියන්ති මැතිණිය සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 10.17)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා:**

තල්දූව සති පොළේ සභාවෙන් රුපියල් ලක්ෂ 55 ක් වියදම් කර වැටක් ගසා ගේට්ටුවක් සවි කර තිබෙන බවත් එහි සිද වන කාර්යන් සම්බන්ධයෙන් අවධානයෙන් පසු නොවුණහොත් එම ගේට්ටුද ඉදිරියේදී අහිමි විය හැකි බව පවසා සිටියේය. එම නිසා වැටේ ඉතිරි කොටස ගසා සම්පූර්ණ කරන තුරු ගේට්ටුව ගලවා ඉවත් කර පසුව සවි කිරීමට කටයුතු කරන්නේ නම් එය වඩාත් සුදුසු බව පැවසීය. පසුගිය අගෝස්තු 07 වෙනි දින අලුයම 02 ටත් යම් කිසි පිරිසක් විසින් එහි තහඩු ගැලවීමට කටයුතු කර ඇති බවත් තමන් එම ස්ථානයට යන විටම එම පිරිස දිව ගිය බවත් පැවසීය.එම නිසා එහි කාර්යන් අවසන් වන තුරු අතිරික්ත තහඩු සභාවට හෝ ගෙනවිත් දැමීම සුදුසු බව පෙන්වා දෙන ලදී. එසේම නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේදී සාකච්ඡා සිදු කර එක්වරම ස්ථාන පරීක්ෂණ සඳහා යන විට ඇතැම් අවස්ථා වල මහජන නියෝජිතයන් අසරණ වන අවස්ථාද තිබෙන බව පැවසූ එතුමා මුල් අවස්ථාවේදී මන්ත්‍රීවරු නොමැතිව ගොස් සාකච්ඡා කර එකඟතාවයන්ට පැමිණ පසුව ඒවා සම්මත කර ගැනීම සඳහා පමණක් මන්ත්‍රීවරු රැගෙන යාම සිදු කරන බවත් මේ හේතුවෙන් එම ඡන්දදායකයින් ඉදිරියේදී මන්ත්‍රීවරු අපහසුතාවයට පත් වන බවත් පෙන්වා දෙන ලදී. පසුගිය දිනක ඒ ආකාරයෙන් ඌරුපැලැව්ව ප්‍රදේශයේ කර්මාන්තයක් සිදු කරන ස්ථානයක් පරීක්ෂා කිරීමට ගිය ආකාරය සිහිපත් කළ එතුමා ඒවා එලෙස තහනම් කරන්නේ නම් ගලි බවුසර ගෙනවිත් දැමීමද ඒ ආකාරයට තහනම් කිරීමට කටයුතු කළ යුතු බව පෙන්වා දෙන ලදී. එම කර්මාන්ත ශාලාව හේතුවෙන් අවට පිරිසකට රැකියා ලැබී තිබෙන බවත් යම් කාර්යක් සිදු කිරීමට පෙර ඒ සම්බන්ධයෙන් හොඳින් සොයා බැලීම සුදුසු බව පැවසීය. මේ සිදු වීම හේතුවෙන් අදාල කොට්ඨාසය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරු ලෙස තමන් සහ සහෝදර මන්ත්‍රීතුමා මහත් අපහසුතාවයට පත් වන බවත් ඒ හේතුවෙන්ම මේවා සම්බන්ධයෙන් සාධාරණයක් ඉටු කරන ලෙස ඉල්ලා සිටියේය. එසේම තල්දූව ඇපලපිටිය ගුරුගල්ල අවට ජනතාවගේ කසළ බැහැර කිරීමේ ගැටළුව සම්බන්ධයෙන් අවධානය යොමු කර අඩු තරමින් දිනක් හැර දිනක් හෝ කසළ එකතු කිරීමේ රථය ඒ ප්‍රදේශ කරා යොමු කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය. එසේම තල්දූව වෙළඳපොලේ වෙළඳ කටයුතු සිදු කරන පිරිසගේ පහසුව තකා ඉදිරිපස ඇති කණු අසලගට විදුලි බල්බ සවි කර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය. වෙළඳාම් කටයුතු සිදු කිරීම සඳහා රැගෙන එන භාණ්ඩ රාත්‍රියේදී බැමට යාමේදවී ඔවුන් විශාල අපහසුතාවයකට පත් වන බැවින් මේ සම්බන්ධයෙන් සොයා බලා යම් පියවරක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී. එසේම තල්දූව ප්‍රදේශයේ පොදු ළිං කීපයක් තිබෙන බවත් ඒ තිබෙන ළිං ටික හෝ සභාවේ මැදිහත් වීමෙන් අලුත්වැඩියා කර දෙන ලෙස ඉල්ලා සිටියේය. එසේම සීතා විද්‍යාල මාවතේ ඇති අනතුරුදායක ස්ථානයෙන් යම් අයෙකුගේ ජීවිතයක් අහිමි වීමට පෙර ඒ සම්බන්ධයෙන් අදාල අංශ දැනුවත් කර යම් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

තල්දූව සතිපොළට විශාල මුදලක් වියදම් කර අලුතින් විදුලිය ලබා දීමට කටයුතු කළ බවත් නමුත් සභාවේ මුරකරුවන් සේවකයනක් නොමැති අවස්ථා වල වෙළඳුන් විසින් එම වයර් කපා තාවකාලික වයර් ඈද ගැනීමට කටයුතු කර ඇති බවත් පසු ගිය සතියේ ඒ ආකාරයට විදුලිය ගැනීමට ගොස් එකම වයරයේ දෙපසට

වයර් සවි කර විදුලිය ගැනීමට ගොස් වයර් සියල්ලම සම්පූර්ණයෙන් පිළිස්සීමට ලක් කර ඇති බව පෙන්වා දෙන ලදී. හිතුමතේ විදුලි බල්බ සවි කිරීමට ගොස් මේ ආකාරයෙන් සිදු කර ගැනීම කණගාටුවට කරුණක් බවත් පොළේ සියළුම මඩු ආවරණය වන ලෙස සම්පූර්ණයෙන්ම වයරින් කර විදුලිය ලබා දීමට සභාව විසින් කටයුතු කළ බවත් පවසා සිටියේය. මේ හේතුවෙන් සභා අරමුදලින් අනවශ්‍ය ලෙස මුදල් වැය වීමක් අවස්ථා කීපයකදීම සිදු වී ඇති බවත් මේ සම්බන්ධයෙන් වෙළඳුන් දැනුවත් කර තිබෙන බවත් පවසා සිටියේය. එසේම ගරු මන්ත්‍රීතුමා කී ආකාරයට ඉදිරිපසින් විදුලිය ලබා දීමට ප්‍රමාණවත් කණු නොමැති බවත් අලුතින් වයරින් කර එම කාර්ය සිදු කළ යුතු බවත් පෙන්වා දෙන ලදී. තමන්ට වර්තමාන තත්වය සැඟවීමට කිසිදු අවශ්‍යතාවයක් නොමැති බව පැවසූ ගරු සභාපතිතුමා අද වන විට සභා අරමුදලේ පවතින මුදල් තත්වය මත විදුලි බල්බ හා ඒ කාර්යන් සඳහා අවශ්‍ය අනෙකුත් උපාංග ගැනීමේ ගැටළුවකට සභාව මුහුණ දී ඇති බැවින් මේ කාර්ය කඩිනමින් සිදු කිරීමට නොහැකි තත්වයක් උද්ගතව ඇති බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල කන්දෙආරච්චි මැතිතුමා:**

ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම් දරුක් මැතිතුමා සඳහන් කළ ඌරුපැලැච්ච ප්‍රදේශයේ ඉදි කිරීමට කටයුතු කරනු ලබන කර්මාන්ත ශාලාව ආකාරයේම කර්මාන්ත ශාලාවක් මේ වන විට අටුළුගම ප්‍රදේශයේ පවත්වාගෙන යන බව පැවසීය. එම හිමිකරුවන් මඟින් සිදු කරන ලද ඉල්ලීමට අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඒ සඳහා පසුගිය කාලයේ අවසර ලබා දුන් බවත් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා සිදු කරන ලද ඉල්ලීමට අනුව දීර්ග කාලයක් ඒ සඳහා විරෝධතා තිබෙන බව පවසා එය ප්‍රමාද කළ බවත් මේ මහා සභා රැස්වීම් වලදී එයට විරුද්ධව මන්ත්‍රීවරු විසින් නොයෙකුත් අදහස් ප්‍රකාශ කළ බවත් සිහිපත් කර සිටියේය. එවැනිම ආයතනයක් ඌරුපැලැච්ච ප්‍රදේශයේ ආරම්භ කිරීම සඳහා මාස ගණනකට පෙර ගෙඩනැඟිලි අයදුම් පත්‍රය මේ සභාවට භාර දී තිබුණත්තවමත් ඒ කාර්ය ප්‍රමාද කරන බවත් එසේ ප්‍රමාද කිරීමට හේතු වන කාරණා අදාල පාර්ශවයට දැනුම් දීමට කටයුතු කරන්නේ නම වඩාත් සුදුසු බවත් පෙන්වා දෙන ලදී. ප්‍රදේශයේ ජනතාවගේ විරෝධතාවයක් තිබෙනවාද යන්න සොයා බලන ලෙසත් අද වන විට මධ්‍යම පරිසර අධිකාරියෙන් අදාල නිර්දේශ ලබා දී ඇති සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින්ද අදාල අනුමත කිරීම් සිදු කර ඇති පසුබිමක අනෙකුත් සියළුම නෛතික අවශ්‍යතා සපුරා තිබෙන විට ප්‍රාදේශීය සභාව විසින් මේ ආකාරයට මේ කාර්ය ප්‍රමාද කරන්නේ කුමන හේතුවක් නිසාද යන්න විමසා සිටියේය. එලෙස ප්‍රමාද කිරීමක් සභාව විසින් සිදු නොවිය යුතු බවත් මේ හේතුවෙන් අද වන විට අදාල අයදුම්කරුවන් විශාල අපහසුතාවයකට පත් වී ඇති බවත් පෙන්වා දෙන ලදී. මේ ආකාරයට නිසි අවස්ථා වලදී අවශ්‍ය ලෙස ක්‍රියාත්මක නොවීම හේතුවෙන් මේ රටේ ඉහළ සිට පහළ දක්වාම අද වන විට විශාල අර්බුද රැසකට මුහුණ දී ඇති බැවින් මෙවැනි ගැටළු උද්ගත වූ විට තම නිල බලය තුළ ඍජු තීරණ ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

මේ කර්මාන්ත ශාලාව වසා දමන ලෙස කිසිදු ආකාරයකින් දැනුම් දීමක් පරිසර හා පොදු පහසුකම් කාරක සභාව මඟින් සිදු කර නැති බවත් පසුව සිදු කරන ලද ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී කුමන තීරණයකට එළඹුනාද යන්න සම්බන්ධයෙන් නොදන්නා බවත් පැවසීය. මෙහිදී අදාල පාර්ශවය විසින් අයදුම් කර තිබුණේ වෙළඳ බල පත්‍රයක් බවත් නමුත් ස්ථානය පරීක්ෂා කිරීමේදී පසු කපා කොන්ක්‍රීට් දමා ගොඩනැඟිල්ලක් සෑදීම සඳහා මූලික පියවර ගෙන ඇති බව අවබෝධ වූ බවත් ඒ අනුව ගොඩනැඟිලි අයදුම්පත්‍රය ලබා ගත්තාද යන්න සම්බන්ධයෙන් විමසීමට සිදු වූ බවත් පවසා සිටින ලදී. නමුත් ඒ වන විටත් ඒ කාර්ය සිදු කර නොතිබූ බව පැවසීය.

(ගරු මන්ත්‍රී යශෝධ පද්මසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.30)

මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ලබා දුන් වාර්තාව තමන් පිළි නොගන්නා බවත් ඇතැම් රජයේ ආයතන වල ඇතැම් නිලධාරීන් යම් යම් කාර්යන් නුසුදුසු ලෙස සිදු කරන බැවින් ඒ කාර්ය සඳහා අදාල අනෙකුත් ආයතන වල අනුමැතිය කෙලෙස ලබා ගත්තාද යන්න නොදන්නා බවත් පැවසීය. තමා එයින් අදහස් කලේ සියළුම රජයේ ආයතන හා නිලධාරීන් නොවන බවත් සුළුතරයක් වූ පිරිසක් සම්බන්ධයෙන් පමණක් බවත් පවසා සිටියේය. යම් පුද්ගලයෙකු ආදායම් උත්පාදක මාර්ගයක් පවත්වාගෙන යනවා නම් එකී කර්මාන්තය නැවැත්වීමට අපට නොහැකි බවත් නමුත් ඒ සියළු කාර්යන් සිදු කරනු ලබන නියමිත ක්‍රමවේදයක් තිබෙන බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ කර්මාන්තය ආරම්භ කිරීමේදී කිසිදු ආකාරයක අනුමැතියක් ලබා ගෙන නැති බවත් දුරකථන මාර්ගයෙන් පමණක් එම ස්ථානයේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට යන බව පවසා සිටි බවත් පැවසූ එතුමා පසුව එම ස්ථානය පරීක්ෂා කිරීමට කාර්මික නිලධාරියෙකු යොමු කළ බවත් ඔහු එය පරීක්ෂා කර බලා ආදාල කාර්ය නීත්‍යානුකූලව සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අදාල පාර්ශවයට දන්වා යැවීමට කටයුතු කළ බව පවසා සිටින ලදී. මේ වන විට ඔවුන් විසින් ඒ ලියකියවිලි සභාවට භාර දීමට කටයුතු කර ඇති බවත් මීට පෙර අවස්ථාවකත් අදාල පුද්ගලයා විසින් ගලි බවුසර් කීපයක් මාගම්මන හා තවත් ස්ථානයක නවතා තැබීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර බලා වාර්තාවක් ලබා ගන්නා ලෙස පරිසර හා පොදු පහසුකම් කාරක සභාවට දැනුම් දුන් බබව පැවසීය. ඒ අනුව මේ වන විට එම ස්ථානයට පහළින් ඇති ජල මාර්ගයට අදාල කර්මාන්තය සිදු කිරීමෙන් යම් බලපෑමක් වෙයිද යන්න විමසා බැලීම සඳහා ජල සම්පාදන මණ්ඩලයෙන් වාර්තාවක් ලබා ගැනීමට යොමු කර ඇති බවත් අදාල වාර්තාව ලැබුණු පසුව ගොඩනැඟිලි සැලසුමට අනුමැතිය ලබා දීමට හැකියාව ඇති බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

දෙහිඕවිට කොට්ඨාසය වසර 30ක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් ලෙස මීට පෙර අවස්ථා වලදී නම් අදාල කොට්ඨාසයේ යම් ස්ථාන පරීක්ෂණයක් සිදු වන්නේ නම් ඒ සම්බන්ධයෙන් වසමට අදාල මන්ත්‍රීවරයා දැනුවත් කිරීමේ ක්‍රමවේදයක් තිබූ බවට තමන්ට මතකයක් ඇති බවත් නමුත් අද වන විට එය සිදු නොවන බවත් පවසා සිටියේය. බල ප්‍රදේශයේ යම් ආයෝජනයක් සිදු වනවා නම් ඒ කාර්ය දිරි ගන්නවනු වීනා එයට බාධා කිරීමක් සිදු නොවිය යුතු බවත් රාජ්‍ය ආයතන කොතරම් අකාර්යක්ෂමද කියනවා නම් අනවශ්‍ය කඹ ඇදිලි හේතුවෙන් ඒවායේ කාර්යන් නිසි පරිදි සිදු නොවන බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 10.40)

එම ආයතන මීට වඩා කාර්යක්ෂම විය යුතු බවත් මේ සම්බන්ධයෙන් තමන් පෞද්ගලික අවධානය යොමු කළ පසු මෙය සභාවට දීර්ග කාලීන ආදායම් ලැබෙන ව්‍යාපෘතියක් බවට අවබෝධ වූ බවත් පවසා සිටියේය. මෙමගින් ජල මූලාශ්‍ර වලට හෝ පරිසරයට කිසිදු හානියක් සිදු නොවන බවත් මධ්‍යම පරිසර අධිකාරියෙන්ද සිය නිර්දේශ මේ සඳහා ලබා දී ඇති බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී ශාන්තප්‍රිය පතිරණ මැතිතුමා සභාවට පැමිණෙන ලදී පෙ:ව: 10.42)

එම කර්මාන්තය හේතුවෙන් පාරිසරික හානි සිදු නොවන බැවින් පිළිගත් ආයතන හරහා මේ කාර්ය සිදු කරන බැවින් මෙයට අවසර ලබා දීමෙන් කිසිදු හානියක් සිදු නොවන බව පවසා සිටියේය.ඔඩිට් ඇපරල් ආයතනය මඟින් පවා මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් සිදු කර ඇති බැවින් එවැනි වැදගත් ආයතන මඟින් වා මේ

සම්බන්ධයෙන් තීරණ ගෙන ඇත්නම් මේ සඳහා අවසර ලබා දීමට සභාව විසින් ප්‍රමාද විය යුතු නැති බව පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.44)

1997 වර්ෂයේ දේවාලකන්ද වත්තේ මේ ආකාරයේ ගැටළුවක් උද්ගත වී ස්ථාන පරීක්ෂන සඳහා ගිය බවත් අසූචි මිශ්‍ර ජලය තිබෙන බව පවසා සභාව විසින් ඒ අවස්ථාවේ නඩු දැමීමට ගිය බව සිහිපත් කළ එතුමා එලෙස සිදු කළා නම් අනෙක් පාර්ශවය විසින් වන්දි ඉල්ලා නඩු මහට පිවිසීමට ඉඩ තිබූ බවත් ඉංග්‍රීසි ආණ්ඩු සමයේ ඉදි කරන ලද රබර් කර්මාන්ත ශාලා වල කාණු පද්ධති හා අනෙකුත් අපවහන ක්‍රමවේද වෙනස් කිරීමේ හැකියාවක් නොමැති බැවින් අදාල සියළුම පාර්ශවයන්ට හානි නොවන ආකාරයට එම ගැටළු විසඳීමට ක්‍රියා කළ බව පැවසීය. එලෙස මේ හිමිකරු විසින්ද නඩු මහට පිවිසියහොත් සභාවට විශාල වන්දි මුදලක් ගෙවීමට සිදු වන බව පෙන්වා දුන් එතුමා එවැනි අවධානමක් ලබා නොගෙන මේ ගැටළු විසඳා ගැනීම සුදුසු බව පෙන්වා දෙන ලදී. එසේම මේ වසර හතර පුරාවටම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු වශයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට සංවර්ධන යෝජනා සඳහා මූල්‍ය ප්‍රතිපාදන හිමි වූයේ එක් අවස්ථාවක පමණක් බවත් නමුත් මාසික ගෙවීම් පරීක්ෂා කිරීමේදී යම් යම් ප්‍රදේශ වල සභා අරමුදලිකන් වැඩ සිදුකර ඒවාට අදාල ගෙවීම්ද සිදු කර ඇති බව දක්නට ලැබුණු බව පවසා සිටියේය. දෙබෑගම ගොවි සංවිධානයට කොරසවැල්කනේ මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයට රුපියල් 99,000.00 ක මුදලක් ලබා දී ඇති බව පැවසීය.

(සභාව සෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්. අබේසේන මැතිතුමා:**

එය වසර එක හමාරකට පෙර සපිරි ගමක් ව්‍යාපෘතිය යටතේ සිදු කළ කර්මාන්තයක් බවත් මේ දක්වා එහි රැඳවුම් මුදල් 10% ගෙවා නොතිබූ බැවින් සිදු කරන ලද ගෙවීමක් බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

එසේ නම් මින් ඉදිරියට ගෙවීම් වාර්තා ලබා දීමේදී අදාල ගෙවීම් සිදු කරන ලද්දේකුමන කාර්යක් සඳහාද යන්න සම්බන්ධයෙන් එහි ඉදිරියෙන් සඳහන් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

(සභාව සෝෂාකාරී)

එසේම ප්‍රිමික්ස් සකස් කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගෙන තිබෙන බවත් ඒ සඳහා රුපියල් දෙලක්ෂ හාරදහස් ගණනක මුදලක් වැය කර ඇති බවත් පැවසූ එතුමා එයින් කටයුතු සිදු කිරීම ආරම්භ කර ඇද්ද යන්න විමසා සිටියේය.විදුලි ආලෝකය මහජන උපයෝගිතා සේවාවක් නිසා එය සපයා දීම ප්‍රමුඛ කාර්යක් විය යුතු බව පවසා සිටියේය. මෙරත් හියුම් පයිප්ප ඉල්ලා යෝජනාවක් ඉදිරිපත් වී ඇති බවත් පසුගිය කාලයේ අධික වියදමක් දරා හියුම් පයිප්ප මිලදී ගත් බැවින් මේ අවස්ථාවේ ඊට වඩා ප්‍රමුඛතාවය ලබා දිය යුතු කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී. මසකට වරක් මේ ආකාරයට සභාවට පැමිණ විසිර යාම ප්‍රායෝගික නොවන බවත් අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් තමන් නිරන්තරයෙන් සභාව දැනුවත් කරන බවත් ඒවා ඉවත් කිරීමට ක්‍රියා මාර්ග ගැනීමක් දක්නට නොලැබෙන බව පැවසීය.

(ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා සහ ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 10.56)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

අනවසර ඉදිකිරීම් සම්බන්ධව සොයා බැලීම සඳහා ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීමට කටයුතු කළ අවස්ථාවේදී එය ප්‍රතික්ෂේප කලේ ඔබතුමාම බව පැවසීය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

එය පාලක පක්ෂය විසින් සිදු විය යුතු කාර්යක් බව පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

පාලක පක්ෂය විපක්ෂය ලෙස වර්ග කිරීමක් පනතේ නොමැති බවත් සියළුම මන්ත්‍රීවරුන් මහජන නියෝජිතයන් පමණක් බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.57)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමා:**

අවසර ඉදි කිරීම් සම්බන්ධව සොයා බැලීම සඳහා අදම කමිටුවක් පත් කරන ලෙසත් තමන්ද එය නියෝජනය කිරීමට සූදානම් බවත් පවසා සිටියේය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එසේ නම් ගරු මන්ත්‍රී සෙස්ටස් අර්සකුලරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කිරීමට ක්‍රියා කරන බවත් අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ නම් තමන් විසින් පත් කර දන්වන බවත් පවසා සිටියේය.

(සභාව ඝෝෂාකාරී)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා:**

ඌරුපැලැව්වේ සිදු කිරීමට යන ලී කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් විවිධ අදහස් ඉදිරිපත්වූ බවත් ඇතැම් මන්ත්‍රීවරු එයට අනිවාර්යයෙන්ම අවසර ලබා දිය යුතු බවට ප්‍රකාශ කරන බවත් පැවසීය. මෙ සභාවට ආදායම් ලැබෙන පමණින් ගණිකා නිවාස හෝ සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා අවසර ලබා දෙනවාද යන්න විමසා සිටියේය. ඒ අනුව මේ කර්මාන්තය හේතුවෙන් ජලයට හා අවට  පරිසරයට සිදු වන හානිය සම්බන්ධයෙන් තීන්දු තීරණ ලබා දීම සඳහා අදාල ක්ෂේත්‍රෙය් නිපුණතාවයක් ඇති කිසිවෙකු මේ ස්ථානයේ නොමැති බව පැවසීය.එදා ස්ථාන පරීක්ෂාව සිදු කිරීමට ගිය අවස්ථාවේ අනික් සියළුදෙනාට පෙර ලේකම්තුමා ඒ බොර පැහැයට හැරුනු ජලය දැක එම ස්ථානයට ගිය බව අප දුටු බවත් ඇතැම් ශාක වල පොතු කොළ ආදිය ජලය සමඟ මිශ්‍ර වීම හේතුවෙන් අසාත්මිකතා ආදිය ඇති විය හැකි බව පැවසීය. අටුළුගම සිදුවීම අප විරුද්ධ වූ අවස්ථාවේත් අපගේ සමහර මන්ත්‍රීවරු ඒ සම්බන්ධයෙන් පක්ෂපාතීව කතා කළ බව සිහිපත් කළ එතුමා සභාවට ආදායමක් ලැබෙන පමණින් මිනිසුන්ට හිතුමනාපෙට ඉදිකිරීම් සිදු කර එහි වැඩ අවසන් කර ලැනීමට නොහැකි වූ විට ලියකියවිලි ඉදිරිපත් කර එම කාර්ය සිදු කළ හැකි පසුබිමක් අවශ්‍ය නම් මේ රටට නීතියක් අවශ්‍ය වන්නේ ඇයිද යන්න විමසා සිටියේය. එම නිසා මෙහිදී සභාවක් වශයෙන් අවශ්‍ය නෛතික රාමුව තුළ අදාල කාර්යන් සිදු කර ගැනීම සඳහා ඒ පාර්ශවයන් ක්‍රියා කිරීම යොමු කිරීම සිදු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී.

(සභාව සෝෂාකාරී)

අද වන විට මේ රටේ ජනතාව පත්ව ඇති මේ දුෂ්කර ජීවන රටාවට ඉහළ නිලධාරියාගේ සිට පහළ සේවකයා දක්වාම සිදු කරනු ලබන මහා පරිමාණ වංචනික ක්‍රියාවන්ට හා කොමිස් ගැසීම් බදු වංචා ආදායට යොමු වීම මත මේ තත්වය උද්ගත වී ඇති බව පෙන්වා දෙන ලදී. ස්ථාන පරීක්ෂාවට ගිය අවස්ථාවේ මේ අවසරය ලබා නොදීසිටීමක් සම්බන්ධයෙන් කතා නොවූ බවත් නමුත් ඔවුන් ඒ ඉදි කිරීම සිදු කර ඇත්තේ සභාව හෑල්ලුවට ලක් කර බවත් පැවසීය. එම නිසා අදාල ලියවිලි සම්පූර්ණ කර පසුව අවසර ලබා දෙන්නේ නම් එය වඩාත් සුදුසු බව පැවසූ එතුමා අදාල පුද්ගලයා සමඟ තමන්ගේ පෞද්ගලික අමනාපකමක් නොමැති බවත් සභාවේ අවසරය නිසි පරිදි නීත්‍යානුකූලව ලබා දිය යුතු බවත් පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රී ඒ.ආර්.ඒ.එම්.දරුක් මැතිතුමා සභාවට පැමිණෙන ලදී.පෙ:ව: 10.57)

එසේම පසුගිය දිනක සභාවෙන් වරිපනම් එකතු කිරීමට නිලධාරීන් වසම් මට්ටමින් යන ආකාරය තමන් දුටු බවත් ඔවුන් අදාල ස්ථාන කරා යොමු කිරීම ආදී කාර්යන් සිදු කිරීමට යන වියදම දෙස බැලූ විට දිනකට රුපියල් 5000 ක 6000 ක හෝ ආදායමක් සභාවට ලැබෙන්නේ දැයි සැක සහිත බව පැවසීය. ඒ මුදල එම නිලධාරීන්ටම ලබා දී වරිපනම් අය කිරීම සඳහා වෙනම යොමු  නොකර ගෙවීම් ආයතනයට සිදු කිරීමට අවස්ථාව සලසා දෙන්නේ නම් වඩාත් කාලෝචිත බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා:**

පුදුම සහගත කාරණය නම් පසුගිය සභා රැස්වීමේදී දර කැබලි කිරීමේ කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් දෝෂාරෝපණය කළ මන්ත්‍රීවරු සිටි සභාව අද වන විට නිලධාරීන්ට දෝෂාරෝපණය කරමින්  එයට පක්ෂව ඒ සඳහා අනුමැතිය ලබා දිය යුතු බවට ප්‍රකාශ කරමින් කතා කිරීම බව පවසා සිටියේය. තමන් අඩු තරමින් ඒ කර්මාන්ත ශාලාව තිබෙන ස්ථානයවත් නොදන්නා බවත් මේ සභාවේදී කතා වන කරුණු වලින් පමණක් අදාල සිදු වීම සම්බන්ධයෙන් තොරතුරු දැනගෙන තමන් මේ ආකාරයට කතා කරන බවත් පවසා සිටි එතුමා පසුගිය රැස්වීමේදී වහාම එහි කටයුතු නැවැත්විය යුතු බවට ප්‍රකාශ කර අද වන විට නිලධාරීන් කාර්යක්ෂම නොමැති බවත් අදාල කාර්ය සඳහා අවසර ලබා දීම ප්‍රමාද කරන බවත් චෝදනා කරන බව පැවසීය. සිදු කරනු ලබන ව්‍යාපාරය නිවැරදි ආකාරයට නීත්‍යානුකූලව පමණක් සිදු කරන්නේ නම් ඒ ආකාරයට නිලධාරීන් රාජකාරි පැහැර හර සිටීම සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගැනීමට පුරවැසියන් ලෙස අප සැමට හැකියාව තිබෙන බව පැවසූ එතුමා නිලධාරීන්ට සහ ආදාල ආයතන වෙත ලබා දෙනු ලබන වාර්තාව පාදක කරගෙන මේ සම්බන්ධයෙන් අප කතා කළ යුතු බව පවසා සිටියේය. පසුගිය සභාවේදී මේ සමබන්ධයෙන් ඉතාමක් ඉහළ ස්වරයෙන් බහුතරයක් දෙනා කතා කළ බව සිහිපත් කල එතුමා තමන් කොහොමත් වැටක ගසක් කැපීමට පවා විරුද්ධ බැවින් දැව සම්බන්දයෙන් සිදු කරනු ලබන කර්මාන්ත සඳහා අවසර ලබා දීම අනුමත නොකරන බව පවසා සිටියේය. පරිසර හා පොදු පහසුකම් කාරක සභාවේ සභාපතිතුමා පැවසූ ආකාරයට මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඒ කාර්යයේ තීරණ ගැනීමේ වගකීම සභාව වෙත පවරා ඇත්නම් ඔවුන් මේ සම්බන්ධයෙන් වගකිව යුතු බවට එම ආයතනය වෙත දන්වා යැවීම සිදු කළ යුතු බව පැවසීය. මේ කර්මාන්තය හේතුවෙන් ජල මූලාශ්‍ර වලට සිදු වන්නේ කුමක්ද අදාල කර්මාන්තය කරගෙන යාම යෝග්‍ය වන්නේද යන්න සම්බන්ධයෙන් වාර්තාවක් මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිකුත් කර තිබිය යුතු පවත් එම වාර්තාව පාදක කරගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට ක්‍රියා කිරීම වඩාත් සුදුසු බවත් පෙන්වා දෙන ලදී.

(ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ;ව: 11.16)

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මේ කර්මාන්ත ශාලාවට අදාල අයදුම්පත්‍රය ලබා දුන්නේ ජූනි 19 වෙනි දින බවත් මධ්‍යම පරිසර අධිකාරියේ වාර්තාව මැයි 30 වෙනි දින ලබා දී ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ වාර්තාව ජූනි මාසයේ ලබා දී ඇති බවත් පවසා සිටියේය.

(ගරු මන්ත්‍රීඩී.එස්.එම්.නිමල් මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.18)

තමන් පෞද්ගලිකව ජල සම්පාදන මණ්ඩලයෙන් අදාල වාර්තා ඉල්ලා ලිපි යොමු කර ඇති බවත් අදාල වාර්තාව ලැබෙන තෙක් තමන් එකී අවසර පත්‍රය අත්සන් නොකරන බවත් පැවසීය. කවුරුන් කුමක් ප්‍රකාශ කළත් තමන් සභාපති ධූරය දරන තාක් එකිනෙකාගේ හිතවත්කම් සහ බලයට යටත්ව මේ කාර්යන් සඳහා අනුමැතිය ලබා දිම කිසිසේත් සිදු නොකරන බව පවසා සිටියේය.මේ සිදුවීම සම්බන්ධයෙන් අදදින සභාවේදී කතා විය හැකි බව තමන් දන්නා බැවින් එයට අදාල ගොනුව සභාවට රැගෙන විත් ඇති බවත් අවශ්‍ය නම් ඕනෑම මන්ත්‍රීවරයෙකුට ඒවා පරීක්ෂා කළ හැකි බවත් පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුගත් මාධව මැතිතුමා:**

ඌරුපැලැව්ව කර්මාන්ත ශාලාව සම්බන්ධයෙන් මෙම සභාවේදී මන්ත්‍රීවරුන් විසින් පළකරන ලද අදහස් දෙස බැලීමේදී අදාල ව්‍යාපාරිකයා ආරම්භයේදීම තමන් විසින් සිදු කිරීමට අපේක්ෂිත ව්‍යාපාරය කුමක්ද යන වග සභාවට සඟවා යම් වංචාවක් සිදු කර ඇති බව අවබෝධ වන බව පවසා සිටියේය.

(ගරු මන්ත්‍රී යූ.ආර්.ඒ.සී.කරුණාරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රීනී නයනා ප්‍රියන්ති මැතිණිය සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 11.22)

මධ්‍යම පරිසර අධිකාරියේ වාර්තාවේ සඳහන් වන්නේ සභාවේ නීතිරීති වලට අනුකූලව පවත්වාගෙන යා යුතුයි යනුවෙන් බවත් එම නිසා මෙය නුසුදුසු ව්‍යාපාරයක් නම් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ හැකියාව සභාව සතුව පවතින බව පවසා සිටියේය. ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබා නොදෙන ලෙස තමන් කිසිම විටෙක නොපවසන බවත් නමුත් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම සභාව විසින් සිදු කළ යුතුව ඇති බවත් පෙන්වා දෙන ලදී.

(ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා සහ ගරු මන්ත්‍රීනී නයනා ප්‍රියන්ති මැතිණිය සභාවට පැමිණෙන ලදී. පෙ:ව: 11.23)

තමන් දන්නා ආකාරයට සබරගමුව හා බස්නාහිර පළාත් ආවරණය වන ලෙස අක්කර 400 ක පමණ භූමි කොටසක් ආයෝජන ප්‍රවර්ධන කටයුතු සඳහා වෙන් කර ඇති බවත් අපනයන කර්මාන්ත ශාලාවක උප ව්‍යාපෘතියක් ලෙස මේ කාර්ය සිදු කරන බැවින් අදාල භූමියේ මේ සඳහා ඉඩක් වෙන් කර ගත හැකි වනු ඇති බව පවසා සිටියේය. මේ ව්‍යාපාර බාහිර සමාජයට ඒම යම් ආකාරයන හානිදායක තත්වයක් බැවින් අදාල භූමි කොටසේ එකී කාර්යන් පවත්වාගෙන යාම සඳහා සුදුසු ලෙස සකසා ඇති බැවින් ඒ කර්මාන්ත ශාලා එම ස්ථානයේ ඉදි කළ හැකි බව පවසා සිටියේය. එලෙස මහා පරිමාණ ව්‍යාපාරයක උප කාර්යාලයක් බාහිර සමාජයේ විවෘත කිරීමේ හැකියාවක් තිබෙනවාද යන්නත් සොයා බැලිය යුතු බව පෙන්වා දෙන ලදී. මේ ව්‍යාපාරය සභාවට දීර්ග කාලීන ආදායම් ලැබෙන කාර්යක් ලෙසින් ඇතැම් මන්ත්‍රීවරු විසින් හඳුන්වා දුන් බවත් එසේ වූ පමණින් හෝ හිතවත්කම් මත පරිසරයට හෝ සමාජයට අහිතකර ව්‍යාපාර සඳහා සභාව මඟින් අනුමැතිය ලබා දිම සුුදුසු වන්නේ දැයි විමසා සිටියේය. ව්‍යාපාරිකයන් පෞද්ගලිකව මන්ත්‍රීවරුන්ට උදව් ලබා දුන් පමණින් ඔවුන් විසින් සිදු කරන සියළු කාර්යන් සඳහා සභාව අනුමැතිය ලබා නොදිය යුතු බවත්

එලෙස සිදු කිරීමට නම් මේ මහා සභාව අවශ්‍ය නොවන බවත් මෙය විසුරුවා හැර නිලධාරීන්ට මේ කාර්යන් සිදු කරගෙන යාම සඳහා ඉඩ ලබා දි හැකි බවත් පවසා සිටින ලදී. පෙර වැරදි සිදු කර ඇති පුද්ගලයන් විසින් යම් කාර්යක් සිදු කිරීමේදී ඒ සම්බන්ධයෙන් පැහැදිලි වාර්තාවක් අදාල අංශ වලින් ලබා ගෙන ඉතාමත් සුපරික්ෂාකාරිව එය සිදු කළ යුතු බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

පසුගිය මහා සභා රැස්වීමේදීත් මේ සම්බන්ධයෙන් කතා කළ බවත් එදා ඉතා දැඩි ප්‍රතිපත්තියක සිටි සභාව අද වන විට යම් ආකාරයක ලිහිල් ප්‍රතිපත්තියක් මේ සම්බන්ධයෙන් අනුගමනය කරන බවක් දක්නට ලැබෙන බව පවසා සිටියේය. යම් යම් කාරණා සම්බන්ධයෙන් වාර්තා ලබා දෙන ලෙස අදාල ආයතන වලින් ඉල්ලා ඇත්නම් ඒ වාර්තා ලැබෙන තෙක් මේ කරුණ සම්බන්ධයෙන් නැවත නැවත මේ සභාවේ කතා කරමින් කාලය අපතේ යැවීමට ඉඩ ලබා නොදෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින බව පවසා සිටියේය. කොතරම් කතා කළත් අවශ්‍ය වාර්තා නොමැතිව අදාල කාර්ය සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට නොහැකි බැවින් නැවත නැවත ඒ සම්බන්ධයෙන් කතා කරමින් කාලය වැය කිරීම සුදුසු නොවන බවත් පසු ගිය සභා වාර්තාවේ 22 පිටුවේ අදාල වාර්තා ලබා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියට සහ ජල සම්පාදන මණ්ඩලයට යොමු කර ඇති බවට සඳහන් කර ඇති බවත් එලෙස සඳහන් කර තිබියදී මන්ත්‍රීවරුන් විසින් එකම කාරණය නැවත නැවත මේ ආකාරයට සාකච්ඡා කරන්නේ ඇයිද යන්න විමසා සිටින ලදී.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

කොතෙක් ඒ සම්බන්ධයෙන් පැහැදිලි කළත් මන්ත්‍රීවරුන් ඒවා ගණනකට නොගෙන මේ ආකාරයන් එකම කාරණය සඳහා සභාවේ කාලය වැය කිරීම තමන්ද අනුමත නොකරන බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් රාජපක්ෂ මැතිතුමා:**

එසේම මේ සිටින දේශපාලන නියෝජිතයන් විසින්ම සභාවේ සිටින නිලධාරීන්ට චෝදනා කරන බවත් අදාල සිදු වීම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග ගෙන ඒ වාර්තා ලැබීමට යම් නිශ්චිත කාලයක් යන බව දැන දැනත් මේ ආකාරයෙන් නිලධාරීන්ට චෝදනා කිරීම අනුමත කළ හැකි කරුණක් නොවන බව පවසා සිටියේය. එවැනි අවස්ථා සඳහා ඉඩ ලබා නොදෙන ලෙස ගරු සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටින බවත් යම් කර්මාන්තයක් සඳහා අවසර ලබා දීමේදී ඉදිරි වසර 10 ක කාලය දෙස අප අවධානය යොමු කළ යුතු බවත් එකී කර්මාන්තයෙන් සිදු වන හිතකර මෙන්ම අහිතකර යම් විපාක තිබෙනවාද යන්න සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම සොයා බැලිය යුතු බවත් පවසා සිටින ලදී. හම නිසා නිශ්චිත කාලයක් ගෙන අදාල තොරතුරු නිවැරදිව ලබා ගන්නා තෙක් ඉවසා සිටිය යුතු බවත් එසේ සිදු නොකර පෞද්ගලික හිතවත්කම් මත ව්‍යාපාරිකයන්ට සහය ලබා දීමට ගොස් ඒ සඳහා නිලධාරීන්ට එකී කාර්යන් කඩිනමින් සිදු කරන ලෙස බලපෑම් සිදු කිරීම හෝ එසේ සිදු නොවන විටට ඔවුන්ට චෝදනා කිරීම කිසිසේත් සාධාරණ නොවන බව පවසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා:**

පසුගිය සභාවේදී මේ ස්ථානයේ වැඩ තාවකාලිකව නවතා අදාල වාර්තා ලබා ගන්නා බවට තීරණය කර තිබියදීත් එම කාර්ය සිදු කරමින් තිබූ බවත් තමන් ඒ අවස්ථාවේදී තමන් දුරකථන මාර්ගයෙන් ඒ සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට සහ ලේකම්තුමාට දැනුම් දුන් බව පැවසීය. රාජ්‍ය නිලධාරීන් ඍජුව සිය කාර්ය සිදු කරනවා නම් කිසිම මන්ත්‍රීවරයෙකුට වංචාවක් සිදු කිරීමට හෝ වැරදි තීන්දු තීරණයක් ගැනීමට

අවස්ථාව නොලැබෙන බව පැවසීය. එලෙස සිදු නොකර මේ සෑම සිදුවීමක්ම දූෂිත පාලනයකට යොමු කර ඇත්තේ රාජ්‍ය සේවකයා විසින් බවත් අද වන විට දේශපාලඥයන්ට වන්දි ගෙවීමට සිදු වී ඇත්තේද ඔවුන්ගේ එම ක්‍රියා වලට බව පවසා සිටින ලදී. මීට පෙර අවස්ථාවක මුරුත්තෙට්ටුව ප්‍රදේශයේ ගලි බැහැර කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා යෝජනා වූ බවත් ස්ථාන පරීක්ෂාවකට ගිය අවස්ථාවේදී නිලධාරීන් විසින් ඒ කාර්ය එම ස්ථානයේ සිදු කළ හැකි බවට ප්‍රකාශ කළ බවත් නමුත් කුඩා ගංවතුරකට හෝ එම ස්ථානය යට වන බැවින් තමන් ඒ සඳහා විරුද්ධ වූ බව පවසා සිටියේය. පසුව තමන්ට වි ිවිධ දුරකථන ඇමතුම් පැමිණි බවත් ඒවා මඟින් මේ කාර්ය සඳහා මැදිහත් නොවන ලෙස තමන්ට දැනුම් දුන් බවත් පවසා සිටියේය. රතු පස්වල සිදු වූයේත් මේ ආකාරයේම සිදු වීමක් නිසා එවැන්නක් මෙහි සිදු වන්නට ඉඩ නොදෙන ලෙස තමන් ඒ අවස්ථාවේදී ප්‍රකාශ කළ බව සිහිපත් කළ එතුමා රාජ්‍ය නිලධාරීන්ට හිතු මනාපයට ක්‍රියා කිරීම සඳහා අවස්ථාව ලබා නොදී ඒ කාර්යන් සම්බන්ධයෙන් සොයා බැලීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී.

(ගරු මන්ත්‍රිනී එම්.බී.ආර්.එන්.එල්ලාවල මැතිණිය සහ ගරු මන්ත්‍රිනී අජන්තා සුමනදාස මැතිණිය සභාවෙන් පිටතට යන ලදී. පෙ:ව: 11.36)

ඌරුපැලැව්ව සිදුවීමේදීත් මුල සිටම රාජ්‍ය නිලධාරියා විසින් කාරක සභාවේ මන්ත්‍රීවරුන් නොමග යැවීමට ක්‍රියා කළ බව පැවසීය. ස්ථාන පරීක්ෂණයට යන අවස්ථාවේදීත් එම ස්ථානයේ ගැටළුවක් නොමැති බවට ඔහු විසින් ප්‍රකාශ කළ බවත් නමුත් මධ්‍යම පරි ිසර අධිකාරියේ වාර්තාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව එය බලපත්‍රයක් නොවන බවත් අදාල කර්මාන්තය සිදු කරගෙන යාම සඳහා ප්‍රාදේශීය සභාවෙන් අවසර ලබා ගත යුතු බවත් අවබෝධ වූ බව පවසා සිටින ලදී. පසුගිය මහා සභා රැස්වීමේදී විකුම් චන්දන මැතිතුමා විසින් මේ කර්මාන්ත ශාලාව නිසා ප්‍රදේශයේ ජල මූලාශ්‍ර වලට හානි සිදු වී නගරයට බෙදා හරිනු ලබන ජලයේ යම් ගැටළු ඇති විය හැකි බවට ප්‍රකාශ කළ බව සිහිපත් කර සිටියේය. ඒ අකාරයට බැලීමේදී රාජ්‍ය සේවයේ යම් නිලධාරීන්ගෙන් සිදු වන අකටයුතුකම් පරීක්ෂා කිරිම සඳහා මහජන නියෝජිතයන් තේරී පත් වී ඇති බව පවසා සිටින ලදී. තමන් මේ පවසන්නේ සියළුම රාජ්‍ය නිලධාරීන් සම්බන්ධයෙන් නොවන බවත් රාජ්‍ය නිලධාරීන්ගේත් යම් පිරිසක් අවංකව සිය කාර්ය සිදු කරමින් කටයුතු කරන බව පවසා සිටියේය. සිදු කරන ලද කිසිදු කාර්යක් අධික්ෂණය කිරීමක් හෝ සොයා බැලීමක් නොරකන ඇතැම් මන්ත්‍රීවරු යම් ලෙසකින් මුරුත්තෙට්ටුවේ ගලි බැහැර කිරීමේ මධ්‍යස්ථානය ස්ථාපිත කළා නම් ඒ සඳහාද අවසර දෙනු ඇති බව පවසා සිටියේය.

(සභාව සෝෂාකාරි)

ජ්‍යෙෂ්ඨ යැයි කියා ගන්නා ඇතැම් මන්ත්‍රීවරු සභාවේ කාර්යන් වලදී දක්වන ප්‍රතිචාර සම්බන්ධයෙන් කණගාටු වන බවත් හිතවත්කම් හේතුවෙන් සුදුසු නොවන කාර්යන් සඳහා අනුමැතිය දිය යුතු බවට ප්‍රකාශ කරනවා වෙනුවට මේ සභාවේ උන්නතිය වෙනුවෙන් යම් කාර්යක් සිදු කිරීම සඳහා සහය ලබා දීම වඩාත් සුදුසු බව පෙන්වා දෙන ලදී. මේ ව්‍යාපෘතියට තමන් එදත් විරුද්ධ වූ බවත් ඉදිරියටත් විරුද්ධ වන බවත් පැවසූ එතුමා මේ කාර්ය සඳහා අවසර ලබා දීමට මෙතරම් හදිසි වන්නේ ඇයිද යන්න විමසා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.එම්.ෆර්හාන් මැතිතුමා:**

ගරු මන්ත්‍රී .ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා සඳහන් කළ ආකාරයට අටුළුගම කර්මාන්ත ශාලාව ආරම්භ කරන අවස්ථාවේදී එයට විරුද්ධව බෙහෝ පිරිසක් හඬ නැඟූ බවත් නමුත් අද වනවිට එයට පක්ෂව බොහෝ මන්ත්‍රීවරු කතා කරන බවත් පැවසීය.

(ගරු මන්ත්‍රී කෝසල ජයවීර මැතිතුමා , ගරු මන්ත්‍රී ප්‍රියන්ත උදයකුමාර මැතිතුමා, ගරු මන්ත්‍රී විකුම් චන්දන මැතිතුමා සභාවෙන් පිටතට යන ලදි.පෙ:ව: 11.46)

අද වන විට ඉන්ධන ගැටළුව විශාල වශයෙන් විවිධ ක්ෂේත්‍ර වලට බලපෑම් සිදු කර ඇති බවත් සතියට ලබා දෙනු ලබන ඉන්ධන ලීටර් 05 ක ප්‍රමාණය ත්‍රී රෝද රථ රැකියාවේ නිරත රියදුරන්ට ප්‍රමාණවත් නොවන බැවින් සභාවේ ලියාපදිංචි ත්‍රී රෝද රථ රියදුරන්ට හෝ ඉන්ධන ලබා ගැනීමේදී යම් සහනයක් ලබා දිමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටියේය. එසේම අයාලේ යන සුනඛයන් බෝ වීම මත බොහෝ ප්‍රදේශ වල පාසල් ළමුන් ඇතුළු පිරිස් අපහසුතාවයට පත් වන බවත් මේ සඳහා යම් පිළියමක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමඟ එක්ව හෝ සකස් කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී. එසේම තම වසමට අයත් කැලෑගම පාසල අසල දෙපසින් අනාරක්ෂිත පාලම් දෙකක් තිබෙන බවත් අද වන විටත් ඒ පාලම් දෙක දෙපසට වැටක් හෝ වෙනත් ආරක්ෂිත ආවරණයක් ඉදිකර නැති බවත් පෙන්වා දෙන ලදී. එසේම එම පාසල අසල ගසක් විදුලි කම්බියට පාත් වී ඇති බවත් අනාරක්ෂිත තත්වයක පවතින එය ඉවත් කිරීමට මේ වන තෙක් කටයුතු කර නැති බවත් විදුලි බල මණ්ඩලයට ඒ සම්බන්ධයෙන් දන්වන ලෙස ඉල්ලා සිටියේය.

**ගරු උප සභාපති විමුක්ති ජයරත්න මැතිතුමා:**

බල ප්‍රදේශයේ සවි කර ඇති වීථි පහන් අතුරින් කල් ඉකුත් වීමේ දිනයට පෙර පිළිස්සී ගොස් ඇති තවමත් වගකීම් කාලය තිබෙන්නා වූ වීථි පහන් තිබෙන බවත් ඒවා කණු වලින් ගලවා ඉවත් කරගෙන සභාව වෙත රැගෙන ඒමට කටයුතු කරන ලෙසත් වගකීම් කාලය තුළ ඒවා වෙනුවට අලුත් වීථි පහන් ලබා ගැනීමට කටයුතු කළ හැකි වනු ඇති බව පවසා සිටියේය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් විජේසිරි මැතිතුමා:**

පසුගිය අවස්ථාවේදී අටුළුගම සිදු වීමට මුලින්ම විරුද්ධ වූයේ තමන් බවත් නමුත් ඒ අවස්ථාවේදී ගරු මන්ත්‍රී ෆර්හාන් මැතිතුමා ඒ සඳහා අවසර ලබා දිය යුතු බවට ප්‍රසිද්ධියේම ප්‍රකාශ කළ බවත් ගමේ මිනිසුන් ගසක අත්තක් කපා යම් මුදලක් උපයා ගන්නේ නම් එයට විරුද්ධ නොවිය යුතු බවට පවසා සිටි බව සිහිපත් කර සිටියේය. නමුත ගසේ වැටක් එළිවන විට කපා දැමීම, කුඩා පැළ කපා දැමීම ආදියේ විපාක පහදා දෙමින් ඒ අවස්ථාවේදීත් අප එයට විරුද්ධ වූ බව පැවසීය. අද වන විට ප්‍රදේශයේ ඉනි වැටවල් දක්නයට නොමැති බවත් තමන් අවශ්‍යතාවයක් සඳහා වගා කළ ගිනිසීරියා ගස් මේ ආකාරයෙන් කපා ගැනීම සඳහා යම් පුද්ගලයෙකු තමාගෙන් විමසූ බවත් තමන් එයට විරුද්ධ වූ බවත් පැවසූ එතුමා ඒ ආකාරයට එහි අහිතකර විපාකය හඳුනාගෙන කල් තියා ඒවා පෙන්වා දීමට ක්‍රියා කළ බවත් පවසා සිටින ලදී. අද වන විට ඉන්දියාවේත් දම්රෝ කර්මාන්ත ශාලා තහනම් කරන තත්වයකට පත්ව ඇත්තේ මේ හේතුවෙන් වනාන්තර පද්ධතිය විනාශ වීම මත බව පවසා සිටියේය. ඉන්ධන මිල ඉහළ ගියත් මෙවැනි කර්මාන්ත ශාලා වැඩි වනවා මිස අඩු වීමක් දක්නට නොමැති බවත් කාලයක් පුරාවට සිදු කරනු ලබන මෙම ක්‍රියාවලිය හේතුවෙන් අවසානයේ අපගේ දරුවන්ට හුස්ම ගැනීමට ඔක්සිජන් නොමැති තත්වයක් ඇති විය හැකි බව පෙන්වා දෙන ලදී. මෙවැනි එක් කර්මාන්ත ශාලාවකට අවසර ලබා දුනහොත් එවැනි කර්මාන්ත ශාලා එකින් එක බල ප්‍රදේශය පුරාම ඉදි වීම නැවැත්විය නොහැකි වනු ඇති බවත් ඒ නිසා ආරම්භයේදීම මේවායේ ආදීනව අවබෝධ කරගෙන බුද්ධිමත්ව කටයුතු කිරීම වඩාත් සුදුසු බව පැවසීය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

මධ්‍යම පරිසර අධිකාරියෙන් ලබා දී ඇති වාර්තාවේ සඳහන් කරුණු පැහැදිලිව දක්වා නොමැති බවත් එම වාර්තාව නිසි පරිදි අධ්‍යනය කළ යුතු බවත් පැවසීය. ඇතැම් අවස්ථාවල එවැනි ආයතන වලින් ලබා දෙන

නිර්දේශ වලට ඉහලින් යාමට සභාවට නොහැකි බවත් එසේ සිදු වුවහොත් ඔවුන් අපට විරුද්ධව අධිකරණයට පවා යා හැකි බව පෙන්වා දෙන ලදී. එම නිර්දේශ වල යම් ගැටළුකාරි බවක් දක්නට ලැබෙන්නේ නම් ඊට ඉහල ආයතන වලින් ඒ සම්බන්ධයෙන් විමසා සිටීමේ හැකියාව අප සතු බවත් එසෙ෦් නොමැතිව ක්‍රියා කර අදාල පුද්ගලයා අධිකරණයේ සහය පැතුවහොත් එයින් සභාව අපකීර්තියට ලක් විය හැකි බැවින් ක්‍රමානුකූලව එම කාර්යන් සිදු කළ යුතු බව පෙන්වා දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.එම්.නිමල් මැතිතුමා:**

වෙනත් කරුණු යටතේ පැය තුනකට වඩා කාලයක් එකම කාරණාවකට වැය කරනවා වෙනුවට එය සිදු කළ හැකිද නොහැකිද යන්න සම්බන්ධයෙන් පැහැදිලි තීරණයක් අදාල වාර්තා ලැබුණු පසු ලබා ගැනීමට හැකියාව තිබියදී මේ සභාවේ වටිනා කාලය මෙලෙස මිඩංගු කිරීම සම්බ්න්ධයෙන් කණගාටු වන බව පවසා සිටින ලදී.

( ගරු මන්ත්‍රී රනිල් චන්ද්‍රකුමාර මැතිතුමා සභාවෙන් පිටතට යන ලදී.පෙ:ව: 11.59)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල ජයසිරි මැතිතුමා:**

අද වන විට මේ ප්‍රදේශයේ නැවත ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමේ අවධානමක් පවතින බවත් මාදොල ප්‍රදේශයේ දෙදෙනෙකුගේ ජීවිත ඩෙංගු රෝගය නිසා අහිමි වූ බව පැවසූ එතුමා මේ සම්බන්ධයෙන් සභාව දැනුවත් කළ අවස්ථාවේදී ගරු සභාපතිතුමා කඩිනමින් ක්‍රියාත්මක වී කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සහභාගී කරවාගෙන ඩෙංගු මර්ධන වැඩසටහනක් සාර්ථකව ක්‍රියාත්මක කළ බව පවසා සිටියේය. මේ කාර්ය සාර්ථක කර ගැනීම සඳහා දායකත්වය ලබා දුන් ගරු සභාපතිතුමා, ලේකම්තුමා ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලය වසම භාර මන්ත්‍රීවරයා වශයෙන් සිය ස්තුතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසා සිටින ලදී.

(ගරු මන්ත්‍රී ඩී.ජී.එස්.සී.කේ.පියරත්න මැතිතුමා සභාවෙන් පිටතට වක ලදී. ප:ව: 12.00)

මාදොල ප්‍රදේශයේ සභාවට අයත් බිම් කොටසක් තිබෙන බවත් එහි රබර් ගස් ගණනාවක් තිබූ බවත් අවට පිරිස් විසින් ඒවායේ ගස් වරින් වර කපිගෙන ගොස් මේ වන විට ඉතාමත් සුළු ප්‍රමාණයක් පමණක් ඉතිරිව ඇති බවත් පෙන්වා දෙන ලදී. එම නිසා ඉතිරි ගස් ටික වෙන්දේසි කළහොත් සභාවට යම් ආදායමක් ඒ මඟින් ලබා ගත හැකි බැවින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ශ්‍රියානි ජයකොඩි මැතිණිය:**

අනුරාධපුර නාගරික මන්ත්‍රීවරියකට පහරදීමක් සම්බන්දයෙන් අද සභාවේදී කතා වූ බවත් ඒ සම්බන්ධයෙන් පළවන පුවත් අනුව අදාල මන්ත්‍රීවරියත් නාගරික කොමසාරිස්වරයාට පහරදී ඇති බවට දැන ගැනීමට ලැ෦බන බවත් පැවසුවාය. කෙසේවෙතත් කාන්තාවකට පහර දීම අනුමත කළ නොහැකි බැවින ඒ සම්බන්ධයෙන් කණගාටු වන බව පවසා සිටියාය. අද වන විට විවිධ ආකාරයෙන් රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාවන් සම්බන්ධයෙන් ඔවුන්ට චෝදනා සිදු කරන බවත් නමුත් සියළුම රාජය නිලධාරීන් ඒ ආකාරයෙන් ක්‍රියා නොකරන බැවින් එය සුදුසු නොවන බව පවසා සිටියාය. පසුගිය දිනවලදී සභා වාර්තාව ලබා දිම සඳහා සභාවෙන් අවස්ථා කීපයකම තම නිවස වෙත ගොස් තිබූ බවත් අත්‍යාවශ්‍ය ගමනක් ගොස් සිටි අවස්ථාවේ තම දුරකථනයද සංඥා ක්‍රියාත්මක නොවීම මත අක්‍රිය වී තිබූ තත්වයක තමන් කාර්යාලයට පැමිණි සැනින් විෂය භාර නිලධාරිනිය හා කාර්ය මණ්ඩලය තමන් පිළිබඳව සොයා බලා වදවූ ආකාරය පිළිබඳව පවසමින් කරුණු විමසූ බවත් එවැනි නිහතමානී නිලධාරීන්ද රාජ්‍ය ආයතන වල සිටින බව පෙන්වා දිය යුතු බවත් පැවසුවාය.

**ගරු සභාපති ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද මැතිතුමා:**

එකම  කාරණය දිගින් දිගටම සභාව තුළ කතා කරමින් කාලය වැය කිරීම තමන්ද අනුමත නොකරන බවත් එක් දිනක් සඳහා රුපියල් ලක්ෂ 07 කට වැඩි මුදලක් ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා සඳහා වැය කරන බැවින් අර්ථවත් යමක් මේ දිනය තුළ සිදු කළ යුතු බව පෙන්වා දෙන ලදී. එම නිසා විවිධ ප්‍රදේශ හා ජප කොටස් නියෝජනය කරමින් මේ සභාව වෙත පැමිණෙන  මහජන නියේජිතයන් ප්‍රදේශයේ සංවර්ධනයට අවශ්‍ය සංවර්ධන යෝජනා ආදිය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙන ලදී. රජයක් මාරු වී තවත් රජයක් බලයට පත් වන සෑම අවස්ථාවකම පෙර පැවති රජයේ මහජන නියෝජිතයන් හොරුන් බව පවසමින් චෝදනා කිරීම දක්නට ලැබෙන බවත් 2015 පසුවත් මේ ආකාරයට රත්තරන් අශ්වයන් ලැම්බෝ ගිනි කාර් රථ ආදිය තිබෙන බවට චෝදනා කළත් ඒ කිසිවක් මේ වන තෙක් තහවුරු කර නොමැති බව පැවසීය. අද වන විට රට පත්ව ඇති මූල්‍ය අර්බුදයේ බලපෑම මේ සභාවටත් එකසේ බලපා ඇති බවත් කිසිදු සංවර්ධන යෝජනාවක් සිදු කිරීමට සභා අරමුදලේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති තත්වයක් තුළ ඒවා සියල්ල පසුවට කල් දැමීමට සිදුව ඇති බව පවසා සිටියේය. අවශ්‍ය ලිපි ආදියට අත්සන් යෙදීම ආදී කාර්යන් සඳහා තමා කාර්යාලයේ රැදී සිටිනවා විිනා වෙනත් සක්‍රීය සංවර්ධන හෝ සුබසාධන කාර්යක් සිදු කිරීම කළ නොහැකි තත්වයකට පත්ව ඇති බව පවසා සිටින ලදී. වරිපනම් වලින් වාර්ෂිකව අපේක්ෂිත මුදල රුපියල් ලක්ෂ 30 ක් වුවත් එම මුදල එකතු නොවන බවත් මුද්දර ගාස්තු උසාවි දඩ ආදී ආදායම ලැබෙන මාර්ග බොහොමයක් අහිමි වීම මත සංක්‍රාන්ති අවදියක කල් ගෙවමින් සිටින බැවින් අවබෝධයෙන් හා  මනා කළමනාකාරිත්වයකින් ක්‍රියා කළ යුතු බව පවසා සිටියේය. පසු ගිය සභා වාරයේ සිටි සභිකවරු 19 දෙනා 34 දක්වා මේ සභා වාරය වන විට වැඩි වී ඇති බවත් ඔවුන්ගේ මාසික දීමනා දුරකථන හා ඉන්ධන දීමනා සඳහා විශාල මුදලක් වැය කරන බවත් පැවසීය. මේ මුදල් ප්‍රතිපූර්ණය නොවන බැවින් සභා අරමුදලේ මූල්‍ය තත්වය පහත ගියහොත් ඉදරියේදී විශාල අර්බුදයකට මුහුණ දීමට සිදුවනු ඇති බව පෙන්වා දෙන ලදී. එසේම ඉන්ධන මිල වැඩි වීම හේතුවෙන් අද විට කසළ එකතු කිරීම සඳහා ට්‍රැක්ටර් රථ සීමා කර යවන බවත් මාසික ඉන්ධන වියදම පමණක් රුපියල් ලක්ෂය ඉක්මවා ගෙවීමට සිදු වී ඇති බවත් පෙන්වා දෙන ලදි. එම නිසා මේ සංකීර්ණ අවස්ථාවේ අඩු ආදායම්ලාභී පළාත් පාලන ආයතනයක් ලෙස මේ අසීරු කාල පරිච්ඡේදයෙන් ගොඩ එන තෙක් ඉවසීමෙන් ක්‍රියා කළ යුතු බවත් ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහ කාර්ය මණ්ඩලයේ දායකත්වය ඉදිරියේදීත් මේ ආකාරයට ලැබෙනු ඇති බවට තමන් විශ්වාස කරන බව පවසා සිටියේය.

දිනයට නියමිත කරුණු සාකච්ඡා කර අවසන් බැවින් අද දින මහා සභා රැස්වීම අවසන් කරන බවත් මීළඟ මහා සභා රැස්වීම 2022 සැප්තැම්බර් මස 06 වෙනි දින පෙ:ව: 09.30 ට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී පැවැත්වෙන බව ප්‍රකාශ කරමින් එදින ප:ව: 12.15 ට මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කරන ලදී.

ඒ.ජී.දමිඳු ශ්‍යාමින්ද,
සභාපති,
දෙහිඕවිට ප්‍රාදේශීය සභාව.